# ශ්‍රී ලාංකේය සංස්කෘත සාහිත්‍යය උදෙසා දවුල්දෙණ ඥානේශ්වර නාහිමිගේ දායකත්වය: විමර්ශනයක්

- ආචාර්ය කණුමුල්දෙණියේ චන්දසෝම හිමි

## හැඳින්වීම

සාහිත්‍ය නිර්මාණකරණයේ කුශලතා ප්‍රකට කළ හැක්කේ ලෝකයේ සීමිත පිරිසකට පමණක් බව සාහිත්‍ය සේවනයෙන් පැහැදිලි වේ. ඉනුත් වාගාඩම්බරයෙන් පරිපූර්ණ අතිපෞරාණික සංස්කෘත භාෂාවෙන් නිර්මාණ කළ හැකි වියතුන් සංඛ්‍යාව සීමිත වේ. අද්‍යතන ශ්‍රී ලංකාවේ සංස්කෘත භාෂාවෙන් නිර්මාණකරණයේ යෙදෙන වියතුන් අතර රාජකීය පණ්ඩිත, ග්‍රන්ථ විශාරද, සංස්කෘත චක්‍රවර්ති දවුල්දෙණ ඥානේශ්වර නාහිමියන්ට ප්‍රමුඛත්වයක් ලැබේ.[1]

වර්තමානයේ උන්වහන්සේ ශ්‍රී ලංකා අමරපුර සංඝ සභාවේ උත්තරීතර මහානායක පදවිය උසුලන අතර උන් වහන්සේගේ භාෂා කුශලතාව, විශේෂයෙන්ම සංස්කෘත භාෂා පටුත්වය උදෙසා විවිධ ආයතන හා සංවිධාන මගින් ගෞරව සම්මාන ප්‍රදානය කොට ඇත. ඒවා නම් මරදාන විද්‍යොදය මහා පිරිවෙණ සංස්කෘත චක්‍රවර්ති ගෞරව සම්මානය, රෝහණ සංඝ සභාව දෛවි භාෂා විශාරද ගෞරව සම්මානය, අමරපුර සිරි සද්ධර්මවංශ මහා නිකායේ එක්නැලිගොඩ පාර්ශ්වය භාෂාන්තර විශාරද ජිනසාසන කීර්ති ශ්‍රී ෂඩ් භාෂා පරමේශ්වර මහා මහෝපාධ්‍යාය ගෞරව සම්මානය, අමරපුර සිරි සද්ධර්මවංශ

07 FEB 2014



මහා නිකාය සංස්කෘත සාහිත්‍ය සරස්වති ගෞරව සම්මානය, ඇමරිකාවේ කැලිෆෝනියා සංඝ සභාව සාහිත්‍යශූරී සම්මානය, ආසියානු බෞද්ධ සාම සම්මේලනය සාම රන් පදක්කම , ශ්‍රී ලංකා ජනාධිපති සම්මානය මෙන් ම අනුරාධපුර, බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය දර්ශනසූරි උපාධිය ද මහානායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ වෙත පිරි නමා ඇති ගෞරව සම්මාන අතර වේ.[2] මේ ලිපියේ අරමුණ වන්නේ දවුල්දෙණ ඥානේශ්වර නාහිමියන් විසින් ශ්‍රී ලාඞකේය සංස්කෘත සාහිත්‍යය උදෙසා සිදු කළ සාහිත්‍ය සේවය විමසා බැලීමයි.

## ප්‍රවේශය

උන්වහන්සේ විසින් සංස්කෘත භාෂාවෙන් සිදු කළ ශාස්ත්‍රීය සේවාව විමර්ශනයට භාජනය කිරීමේදී ඒ සඳහා උන්වහන්සේගේ කෘති අංශ කීපයක් යටතේ වර්ග කළ හැක. එනම්

- ධර්ම කාව්‍ය
- දූත කාව්‍ය
- ශතක කාව්‍ය
- ප්‍රශස්ති කාව්‍ය වශයෙනි.

ධර්ම කාව්‍ය මෙසේය.

- වෛරාග්‍යචින්තා
- ධර්මචින්තා
- යශෝධරාචරිතම්
- මහාමහේන්ද්‍රක්ෂීණාශ්‍රවාගමනම්
- සර්වේ සංස්කාරා විපරිණාමධර්මාඃ

දූත කාව්‍ය එකක් පමණි. එනම්

- යතිදූතම්

උන්වහන්සේගේ කාව්‍යයන් අතර ශතක කාව්‍යයට ද විද්වත් ප්‍රසාදයක් ලැබී ඇත. ඒ කාව්‍යයෝ නම්

- මාරාඞ්ගනා විජයම්
- ශ්වානස්තව කාව්‍යම් වශයෙනි.

උන්වහන්සේ විසින් ප්‍රශස්ති කාව්‍ය අතිවිශාල සංඛ්‍යාවක් රචනා කොට ඇත. ඒවා කීපයක් මෙසේය.

- ආශීඃ පුෂ්පමඤ්ජරීඃ
- හික්කඩුවේ ශ්‍රී සුමංගල ස්වාමීන්ද්‍ර ප්‍රශස්තිඃ
- විදුරපොල ශ්‍රී ප්‍රියතිෂ්‍ය මහානායක ස්වාමීන්ද්‍ර ප්‍රශස්තිඃ
- ශ්‍රී ආනන්ද මෛත්‍රෙය මහානායක ස්වාමීන්ද්‍ර ප්‍රශස්තිඃ
- ශ්‍රී ජගන්නාථ ගුණානුස්මෘතිඃ
- ශ්‍රී වනරත්න මහානේත්‍රෘ ප්‍රශස්තිඃ
- මඩිහේ ශ්‍රී ප්‍රඥාසීහ මහානායක ස්වාමීන්ද්‍ර ප්‍රශස්තිඃ
- කොස්ගොඩ ශ්‍රී ධර්මවංශ මහා නේතා
- දෙවුන්දර ශ්‍රී වාගීශ්වර නායක ස්වාමීන්ද්‍ර ශුභාශිංසනම්
- තලල්ලේ ශ්‍රී ධර්මානන්ද මහානායක ස්වාමීන්ද්‍ර ගුණානුස්මෘතිඃ
- ස්වස්ති ශ්‍රීරස්තු- වැලිගම ශ්‍රී ඥානරත්න ස්වාමීන්ද්‍ර ශුභාශිංසනම් ආදී වශයෙනි.



## ධර්ම කාව්‍ය

### වෛරාග්‍යචින්තා

බු.ව. 2538 (1995) දී නුගේගොඩ, මොඩර්න් මුද්‍රණාලයේ මුද්‍රණය කොට කර්තෘ ප්‍රකාශනයක් ලෙස එළි දැක්වෙන මේ ග්‍රන්ථයේ පරිච්ඡේද තුනකි. පද්‍ය සංඛ්‍යාව 181 කි. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ග්‍රන්ථ විශාරද උපාධිය[3] සඳහා ඉදිරිපත් කළ මෙය තත් සංගමයේ විද්වත් ප්‍රසාදය ලබමින් ඒ උපාධිය උන්වහන්සේ විසින් හිමි කර ගන්නා ලදි. බුද්ධදේශිත ත්‍රිලක්ෂණ අවබෝධය යථාර්ථාවබෝධය පිණිස (නිර්වාණය) හේතු වන බව පෙන්වීම ග්‍රන්ථ රචනයේ මුඛ්‍ය උද්දේශ්‍ය වේ.[4] ග්‍රන්ථය හැඳින්වීමේදී දවුල්දෙණ ඥානේශ්වර නාහිමියෝ මෙසේ සඳහන් කරති.

"බුදුරදුන් වදාළ නිවන ලැබීමට නම් සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය දුඃඛ අනාත්ම යන ත්‍රිලක්ෂණය යථාභූතඥානයෙන් අවබෝධ කර ගත යුතු වෙයි. මේ වෛරාග්‍යචින්තාවේ ත්‍රි ලක්ෂණය වඩන්නෙකුට උපකාර විය යුතු අදහස් ඇතුළත්ව ඇත. මහලු වියේදී නොයෙකුත් කායික මානසික පීඩනයන්ට ගොදුරුවීම අනිවාර්යය. එකුන් අසූ වන වයස ගත කළ මම ද එයින් බැහැර වූවෙක් නොවෙමි"[5]

බෞද්ධ සංස්කෘත ග්‍රන්ථ සම්පාදනයේ පූර්වතමයා ලෙස සැලකෙන්නේ ක්‍රි.ව. පළමු සියවසේ පමණ ජීවත් වූ අශ්වඝෝෂ පාදයාණන් වහන්සේය. උන්වහන්සේ විසින් බුද්ධචරිත හා සෞන්දරනන්ද යන මහාකාව්‍ය ද්වය රචනා කරන ලදි. සංස්කෘත භාෂාව වැනි කඨෝර හා වාගාඩම්බරයෙන් යුක්ත භාෂාවකින් කාව්‍යයක් හෝ ධර්ම ග්‍රන්ථයක් රචනා කිරීම සුකර නොවේ. එහෙත් තික්ත රසැති බෙහෙතක් මිහිරි රසින් වෙලා රෝගියාට ලබා දෙන්නා සේ රසවත් ලෙස එම කාර්ය අශ්වඝෝෂ පාදයාණන් මනාව ඉටු කොට ඇත. එම ක්‍රමවේදය ම අනුගමනය කරමින් ඥානේශ්වර මහනාහිමි මේ ග්‍රන්ථ කාර්යය සම්පූර්ණ කොට ඇත.

ග්‍රන්ථ කර්තෘවරයාගේ අත්දැකීම් පාදක කොට සම්පාදිත මේ ග්‍රන්ථය පරිච්ඡේද තුනකින් යුක්ත වේ. ඒ මෙසේය.

- 1 පරිච්ඡේදය - උපතේ සිට මහලු වියට පත් වන තෙක් ජීවිතයේ පසුබිම විස්තර කිරීම- පද්‍ය සංඛ්‍යාව 42කි.
- 2 පරිච්ඡේදය - මහලු වියේදී ස්වාභාවිකව හටගන්නා දුක් පීඩා මෙන් ම දශකුශලාකුශල, ප්‍රතීත්‍යසමුත්පාදය විස්තර කිරීම- පද්‍ය සංඛ්‍යාව 90කි.
- 3 පරිච්ඡේදය - දුක්ඛ සාගරයෙන් එතෙරවීම පිණිස බුදුරදුන්ට ස්තොත්‍ර පූජා කිරීම හා ලංකාවේ බෞද්ධාගමික ස්ථාන වන්දනා කිරීම - පද්‍ය සංඛ්‍යාව 49කි.

මීට අමතරව ග්‍රන්ථයෙහි ආරම්භයේ හා අවසානයේ සාම්ප්‍රදායික ප්‍රකාශ දෙකකි. එනම් ග්‍රන්ථ ආරම්භයට පූර්වයෙන් විශේෂ ප්‍රකාශයක් කිරීමට කර්තෘ නාහිමි අමතක කොට නැත. ග්‍රන්ථ ආරම්භයේ මෙසේ සඳහන් වේ.

- ප්‍රශස්තිඃ, උපහාරඃ හා සමර්පණම් - මේ සඳහා පද්‍ය 10 ක් වෙන් කොට ඇත. විද්‍යොදය පරිවේණාධිපති අමරවංශ නාහිමි විසින් ග්‍රන්ථය පිළිගැනීම, කනංකේ සුමනතිස්ස නාහිමි හා ජඹුරේගොඩ ප්‍රියරතන මහා නාහිමි සඳහා උපහාර පූජාව මෙන් ම තායිවානයේ ටීච් ටින් හන් ස්ථවිරපාදයාණන් සමර්පණය කිරීම මෙහි ඇතුළත් වේ.
- කර්තෘ සන්දර්ශනම් - කර්තෘ පිළිබඳ මද විස්තරයක් හා ග්‍රන්ථය කිරීමේ අරමුණ පිළිබඳ සුළු විස්තරයක් ද අඩංගු වේ. එය ග්‍රන්ථ අවසානයයි. පද්‍ය සංඛ්‍යාව 03කි.

කර්තෘවරයාණන්ගේ මුඛ්‍ය අපේක්ෂාව වන්නේ තම ජීවිතයට සාපේක්ෂව පාඨක සිතට අනිත්‍යතාව ප්‍රවේශ කරවීමයි. උන්වහනසේ මෙසේ සඳහන් කරති.



ආජාතයා'හං භවේස්මින්නශුභමපි ශුභං කර්ම යද්යච්චිචාය
තේෂාමල්පමල්පං විකලිත මනසා ස්මාරයන්ති ක්‍රමේණ
ආයුර්නේනීයමානං හිමමිව තපනෝ මන්දමන්දං විනාශං
වාර්ධක්‍යං ප්‍රේරයේත් මාං සපදි මම පුරාතත්වමීෂත්
ප්‍රවක්තුම්. (පද්‍ය 04)

'මහළු වයස මම (? මා) උපතේ පටන් මේ භවයේදී යම් යම් හොඳ නොහොඳ කර්ම රැස් කළෙම්ද, ඒ කර්මයන්ගෙන් ටික ටිකක් පිළිවෙළින් විකල් වූ සිතින් සිහිකරවමින් හිරු හිම මෙන් ආයුෂ මදින් මද විනාශයට පමුණුවමින් මගේ පෙර තත්වය මදක් කීමට මා මෙහෙයවයි'. මෙසේ වර්තමාන ජීවිතය පිළිබඳ විස්තර කීමට ආරම්භ කරණුයේ නොදත් මව් කුසයේ කළල අවස්ථාවේ සිටයි. (ප්‍රාක් කර්මශෛෂ ජනිතඃ ප්‍රියමාතෘගර්භේ- පද්‍ය 5). එහෙත් කර්තෘ නාහිමි විසින් යොදනු ලබන උපමා පිළිබඳ සෑහීමකට පත් විය හැකිදැයි විමසිය යුත්තකි. උත්පත්තියෙන් අනතුරුව දෙමාපියන්ගේ හා යුවතියන්ගේ ආදර සෙනෙහස ලබා වැඩෙන දරුවා මව් කුසෙහි ඉතා පහත්, අනාථ වූවෙකි. මේ දරුවා මව් කුසෙහි වැඩී ඇත්තේ ළිං මැඩියෙකු (කූපස්ථ භේකඃ) නැතහොත් සීතලෙන් මැඩුණු වඳුරු පැටියෙකු (ශීතාභිඝාතකපිපොතකවත්) පරිද්දෙනි. ළිං මැඩියා හා වඳුරු පැටියා යන වදන් කණ වැකුණු සැණින් පාඨක සිතට දැනෙණුයේ ප්‍රසන්න හැඟීමක් නම් නොවේ. එසේ වුව ද දරුවා උත්පත්තියෙන් අනතුරුව ලාලනියන් විසින් ඇකයෙහි තබා සැනසීමට තරම් වාසනාවන්ත වීය.[7] කෘත පුණ්‍ය ගුණැති දරුවෙකුගේ බාල කාලය කර්තෘ මෙසේ සනිටුහන් කරයි.

මත්තාලිහංසගණවාසමහාතඩාගේ
විස්තීර්ණශාද්වල්ලතාගෘහවෘක්ෂවෘන්දේ
නා නා විහඞ්ගහරිණව්‍රජසන්නිවේසේ
චෙක්‍රීඩ්‍යතේස්ම විපිනේ'පි පුරා ජනෝ'යම්.
(වෛරාග්‍යචින්තා පද්‍ය 11)

මත් බඹරු හා හංස සමූහයා ඇති, මහා තණ බිම්, ලියමඬුලු, ගස් සමූහය ඇති, නොයෙක් පක්ෂීන් හා මුවන් සමූහයා වාසය කරන වනයෙහි පෙර මෙතෙමේ බොහෝ සෙයින් ක්‍රීඩා කෙළේය. පෙර කී පරිදි ග්‍රන්ථයේ ආරම්භයේදී දරුවාගේ කළල අවස්ථාව 'අසරණ' අවස්ථාවක් ලෙස නිරූපනය කොට නැවතත් දහර කාලය සුපුරුදු කාම භෝගී ජීවිතයක ලක්ෂණ මෙවැනි ප්‍රකාශයන්ගෙන් ප්‍රකට නොවේදැයි ගැටළුවකි. එසේ නොවේ නම් කර්තෘගේ මේ වර්ණනා ශෛලිය රාජ කුමාරයෙකුගේ දහර කාලය 'පිටපත්' කිරීමකි.

දෙවැනි පරිච්ඡේදය ශ්ලෝක 90 කින් (පද්‍ය 43 සිට 132 දක්වා) යුක්ත වේ. එහි විවිධ මාතෘකාවන් කර්තෘ නාහිමි විසින් සඳහන් කොට ඇත. ඒවා පැහැදිලි ලෙස බෙද වෙන් කළ නොහැක. එහෙත් මහලු කාලය, දුර්ජන ආශ්‍රය ප්‍රතික්ෂේප කිරීම මෙන් ම දශ අකුශල ධර්මයන් ද විස්තර කිරීමට ඉතා මහන්සියක් කර්තෘ දරා ඇත. වෘද්ධතාව විස්තර කිරීම කර්තෘගේ මුඛ්‍ය අභිමතාර්ථය නිසා දෝ මහලු කාලය අතිශයෝක්තියෙන් වර්ණනා කිරීමට උත්සාහ දරා ඇති බව පෙනේ. පළමු පරිච්ඡේදයේදී , ග්‍රන්ථ කර්තෘ නාහිමි සම්බුද්ධ ශාසනයේ ශ්‍රමණයෙකු ලෙස ජීවිතයේ යථා ස්වභාවය අවබෝධ කරගැනීමට සාමර්ථ්‍යය ලත් බව විස්තර කෙරේ.[8]

එසේ වුව ද ජීවිතයේ අනිත්‍ය ස්වභාවය වින්දනය කරන පාඨකයාට ජීවිතය පිළිබඳව සම්පූර්ණයෙන් ම විෂාදයක් හටගැනීම වැළැක්විය නොහැක. මක් නිසාද යත් කර්තෘ නාහිමිගේ මධ්‍යස්ථ ප්‍රකාශයක් නොවන අතර අනිත්‍යතාව 'පුනරුක්තියක්' ලෙසින් ම අවධාරණය කරන බැවිනි. එහි මධ්‍යස්ථතාව ගිළිහීමට තවත් හේතුවක් වී ඇත්තේ භික්ෂුවක ලෙසින් උත්තම පුරුෂ දෘෂ්ඨි කෝණයෙන් විස්තරය ආරම්භ කළ ද, ඇතැම් අවස්ථාවක මහ මග යදින යාචකයෙකුගේ ස්වරූපයක් ද පෙන්නුම් කරන ලෙසින් විස්තර වීමයි. එහිදී උත්තම පුරුෂ දෘෂ්ඨිය ගිලිහී ප්‍රථම පුරුෂ දෘෂ්ඨියට කර්තෘ පෙළඹී ඇත.



නිදර්ශන ලෙස දෙවැනි පරිච්ඡේදයේ 85 වැනි ශ්ලෝකයේ සිට 90 වැනි ශ්ලෝකය දක්වා නම් කළ හැක. කෙසේ වුව ද මෙම පරිච්ඡේදයේ 114 වැනි ශ්ලෝකයේ සිට අවසානය දක්වා දශ අකුශල ධර්මයන් හා ෂඩායතන වැනි ධර්ම කාරණයන් විස්තර කිරීම ප්‍රසාදවහ බව කිවයුතුය. සුප්‍රකට පඤ්චස්කන්ධය පිළිබඳ උපමාව නව්‍ය රසයක් ඉස්මතු කිරීමක් බව පෙනේ. ඒ මෙසේය.

සංස්කාරා ජලධෞ තරංගසදෘශා ගච්ඡන්ති තූර්ණං ක්ෂයං
විඥනං ක්ෂණතෝ විනශ්‍යති යථා රේඛා ජලේ රේඛිතා
නාමාදිත්‍යපථේඞ්කිතාක්ෂරසමං නාපාතමාගච්ඡති
රූපේණාභ්‍රසමේන දන්තිරහිතෝ ලොකෝ වනීවච්‍යතේ.
(පද්‍ය 129)

'සංස්කාරයෝ සයුරෙහි රළ සමානය. වහා විනාශයට පැමිණේ. විඥානය දියේ ඇඳි ඉරක් මෙන් වහා වැනසේ. නාමය අහසේ ලියූ අකුරක් මෙන් දක්නට නොලැබේ. වළාකුලක් සම රූපයෙන් හික්මීම නැති ලෝකයා බොහෝ සේ රැවටේ'.[9]

මෙම ග්‍රන්ථයේ 133 වැනි පද්‍යයේ සිට 181 වැනි පද්‍ය දක්වා පද්‍ය 48 ක් තෙවැනි පරිච්ඡේදයේ අන්තර්ගත වේ. එසේ වුව ද මෙහි විවිධ අනුමාතෘකා අන්තර්ගත වේ. එනම් බුද්ධ රත්න නමස්කාරය, කර්තෘගේ නිර්වාණයට පැමිණීමේ අපේක්ෂාව, පුරුෂදම්‍යසාරථී බුද්ධ ගුණය හා ශ්‍රී ලංකාවේ විවිධ බෞද්ධාගමික ස්ථාන වන්දනය වශයෙනි. පෙර කී ශ්ලෝක 48 න් 19 ක් භාවිත කොට ඇත්තේ උක්ත පුරුෂදම්‍යසාරථී ගුණය ප්‍රකාශ කිරීම සඳහාය. ඒ සඳහා ගිරිමේඛලා ඇත් රජු, මාර පරාජය, ආලවක යක්ෂයා, නාලාගිරි ඇතා, අහිංසක (අංගුලිමාල) ආදී වශයෙන් තත් බුද්ධ ගුණය ප්‍රකාශ කෙරෙන සිද්ධි සමූහයක් නිදර්ශන ලෙසින් දක්වා ඇත. ඉන් අනතුරුව ශ්ලෝක 05 ක් බෞද්ධාගමික ස්ථාන වන්දනය සඳහා වෙන් කෙරේ. ඉන් ලංකාවේ සුප්‍රකට ස්ථාන රාශියක් නම් කොට ඇත. එනම් සෙංකඩගල දන්ත ධාතූන් වහන්සේ, ශ්‍රී පාදය, ශ්‍රී මහා බෝධිය,

රත්නමාලි චෛත්‍යය ආදී වශයෙනි. අවසන් 181 වැනි පද්‍යය වෛරාග්‍යචින්තා ග්‍රන්ථය රචනා කිරීමේ පරමාර්ථය සඳහන් කිරීමට වෙන් කොට ඇත. මේ පරිච්ඡේදයේදී කර්තෘ නාහිමිගේ නිර්වාණගාමී අපේක්ෂාව ප්‍රකාශ වන්නේ ඉතා අහිංසක විලාසයෙනි.

කිඞ්කරෝ'හං ත්වදීයෝ විනීතඃ සුතස්-
ත්වං විනේතා ච මාතා පිතා මේ ගුරුඃ
ත්වාං විනාන්‍යප්‍රතිෂ්ඨා භවේන්නාධුනා
තත් භවාන් පාහි මාං නෛකපීඩාර්දිතම් (පද්‍ය 149)

'මම ඔබවහන්සේගේ දසයෙක්මි. කීකරු පුතෙක්මි. ඔබවහන්සේ මගේ නායකයාය. මගේ මවය. මගේ පියාය. ගුරුවරයාය. දැන් ඔබවහන්සේ හැර මට අන් පිහිටක් නැත. එහෙයින් නොයෙක් දුක් විඳින මා භවයෙන් ආරක්ෂා කරනු මැනවි'.

මෙම ග්‍රන්ථයේ පුරුෂදම්‍යසාරථී ගුණය වර්ණනයේදී කර්තෘගේ සංස්කෘත භාෂා වාග් පටුත්වය මනා ලෙස ස්ඵුට වේ. සාලංකාර භාෂා ප්‍රයෝගයෙහි හා ප්‍රායෝගික ජීවිතයෙහි කර්තෘවරයා දක්වන විශේෂතාව පහත පද්‍යයෙන් පැහැදිලි වේ.

ප්‍රියගෞතම භවනේ මම රහසා තිශි භවතා
බහුධාකෘතරතිසඞ්ගමමධුනා ස්මර න හි කිම්?
අචිරාදුදයති මත්තනුතනුජස්තව ජනිතෝ
මම දෙහදශමනේ භව දයිත ප්‍රතිශරණම්. (පද්‍ය 165)

'ප්‍රිය ගෞතමයාණනි, මගේ නිවසේදී ඔබ විසින් රාත්‍රි කාලයෙහි රති සඞ්ගමය දැන් සිහි නොකරන්නේ කිම?. තව ටිකකින් ඔබට දාවූ කුඩා පුතෙක් මගෙන් පහළ වෙයි. වල්ලභයාණනි, මගේ දෙළදුක සංසිඳවීමට පිහිටවන්න'. මෙයින් විස්තර කෙරෙණුයේ චිංචි මානවිකාව නම් තරුණ කාන්තාව බුදුරදුන්ට සිදු කළ අපහාසයයි. මේ අයුරින් තෙවැනි පරිච්ඡේදය



මනා පද සටනාවෙන් හා සංයමයෙන් රචිත ග්‍රන්ථ අවසානයක් ලෙස සැලකිය හැක.

## ධර්මචින්තා

ප්‍රථමයෙන් 1983 වර්ෂයේදී ප්‍රකාශයට පත් වූ මේ ග්‍රන්ථයේ දෙවැනි සංස්කරණය 1998 දී පළවිය. ග්‍රන්ථයේ ආකෘතිය සලකන විට ප්‍රධාන ග්‍රන්ථය පද්‍ය 125 කින් යුක්ත වේ. මෙම පද්‍ය 125 න් අවසන් පද්‍ය 12 ක් වෙන් කොට ඇත්තේ බුද්ධ වන්දනය හා බුදුරදුන්ගේ ප්‍රථම ධර්ම චාරිකාව සිහිපත් කිරීම සඳහාය. ඊට අමතරව ග්‍රන්ථ අවසානයේ උපකාරානුස්මෘති හා කර්තෘ සන්දර්ශනය වෙනුවෙන් ද පද්‍ය විශාල සංඛ්‍යාවක් භාවිත කොට ඇත. එනම් උපකාරානුස්මෘතියේ පද්‍ය 04 කින් සංස්කෘත භාෂාව පිළිබඳ විඛ්‍යාත විද්වතෙකු වූ දමුණුමැයේ ඤාණරතන ස්වාමින්ද්‍රයන් වහන්සේ සිහිපත් කෙරේ. අනතුරුව සඳහන් වන කර්තෘ සංදර්ශනයෙන් කර්තෘ නාහිමියන්ගේ ජන්ම ලාභය පිළිබඳව විස්තර වේ. ඒ සඳහා තවත් ශ්ලෝක 33 ක් වෙන් වේ. කර්තෘ නාහිමියන්ගේ පෞද්ගලික චරිතයේ විස්තර දැන ගැනීමට එය මහෝපකාරී වේ. මේ අයුරින් ග්‍රන්ථයේ ආකෘතිය සකස් වී තිබෙන අතර ග්‍රන්ථයේ අන්තර්ගතය බුද්ධ ධර්මමය කාරණාවන් සඳහා ම වෙන් වූ බව පෙනේ.

නාහිමියන්ගේ සෙසු ග්‍රන්ථවල මෙන් මෙම ග්‍රන්ථයේ ද ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ජීවිතයේ අනිත්‍යතාව මතු කොට දැක්වීමයි. මේ සඳහා ග්‍රන්ථයේ පද්‍ය ප්‍රමාණයෙන් අඩකටත් වැඩි කොටසක් වෙන් කොට ඇත. ජීවිතයෙහි අනිත්‍යතාවේ උච්චතම අවස්ථාව මෙසේ සනිටුහන් කෙරේ.

අන්තර්දුර්ගන්ධපූර්ණං කෘමිකුලනිලයං රක්තපූයාකරාභං
නානාසාරාස්ථිපුඤ්ජං පිශිතපරිවෘතං පූතිචර්මාවනද්ධම්
ලාලාස්වේදාශ්‍රුගර්තං ප්‍රකටිතකුණපං විස්නජාලස්‍ය ලක්ෂ්‍යං
ධිග් ධිග් නිස්සාරභූතං මලඝටසදෘශං භඞ්ගුරං කායමේනම්.
(පද්‍ය 20)

'ඇතුළත දුගඳින් පිරුණකි. පණු සමූහයාගේ කැදැල්ලකි. ලේ සැරව ආකරයකි. නොයෙක් අසාර ඇට ගොඩකි. මසින් වට කරන ලද්දකි. කුණු සමින් වැසුණකි. කෙළ, ඩහදිය, කඳුළු ගුහාවකි. ප්‍රකට කුණපයකි. උවදුරු සමූහයට ලක්වූවකි. නිසරු අශුචි කළයක් සමාන නැසෙන සුළු මේ කයට නින්දා වේවා'. සත්ත්ව සංකල්පයේ යථාර්ථය බුද්ධ ධර්මානුකූලව තවදුරටත් මෙසේ පැහැදිලි කරයි.

උත්පාදස්ථිතිභඞ්ගුරාත්මකවපුර් නම්නශ්ච රූපස්‍ය ච
පුඤ්ජෝ නාත්‍ර තු සත්ත්වමව්‍යයගුණං කශ්චිත් නියන්තාථ වා
අන්ධස්කන්ධගපඞ්ගුවද් ද්විසටනාදේතත් පුනර්වර්තතේ
නෛවාත්මා මරණාත් පරං පරභවං කශ්චිත් ස්ථිරෝ ගච්ඡති.
(පද්‍ය 38)

'උත්පාද,ස්ථිති, භංග යන ලක්ෂණත්‍රය ස්වභාව කොට ඇති මේ සිරුර නාම රූප දෙකේ එක් වීමකි. සත්ත්වයෙක්, ස්ථිර ගුණයක් ද නැත. නියන්තෘ කෙනෙක් ද නැත. අන්ධයාගේ කරපිට නැගුණු කොරා මෙන් නාම රූප දෙක එකට එකතු වීමෙන් පවතී. මරණින් මතු කිසියම් ස්ථිර ආත්මයක් පර භවයට නොයේ'.

මෙම ග්‍රන්ථයේ අනෙක් ලක්ෂණය ලෙස සැලකිය හැක්කේ ධර්ම සාහිත්‍යයේ සෙසු ග්‍රන්ථයන්හි ආභාසය ද යම් පමණකින් හෝ ලබා ඇති බවයි.

ශරීරවිෂවෘක්ෂස්‍ය නෛකාර්තිඵලධාරිණඃ
ඌරුයුග්මං ද්විධාභින්නමහාමූලමිවේක්ෂතතේ. (පද්‍ය 35)

'ඌරු යුග්මය නොයෙක් පීඩන නමැති ඵල දරණ ශරීර නමැති විෂ වෘක්ෂයාගේ දෙකට වෙන් වූ මුල් දෙකකි'. යට සඳහන් පද්‍යය සංස්කෘත සාහිත්‍යයේ ඉතා ප්‍රකට පද්‍යයකි.[10]

යට කී කරුණට අදාළව තවත් නිදර්ශනයක් ද දිය හැක. කර්තෘ නාහිමියන් දක්වනු ලබන මතු සඳහන් පද්‍යය ද සිංහල



සාහිත්‍යයේ ඉතා ප්‍රකට ග්‍රන්ථයක ඡායානුවාදයක් ලෙස කල්පනා කළ හැක.

ආයුඃ තෘණාග්‍රෝදකබින්දුතුල්‍යං
ක්ෂණේන විද්ධවංසනතාමුපෛති
අද්‍යාද්‍ය මෘත්‍යොර් නිකටං සමේති
තස්මාච්ඡිවාර්ථං කුශලං චිනෝත. (පද්‍ය 65)

'ආයුෂ තණ අග පිණි බිඳික් මෙන් ක්ෂණයකින් විනාශයට යයි. අද අද මරුවා සමීපයට පැමිණේ. එහෙයින් නිවන් පිණිස කුසල් රැස් කෙරේවා'. මෙම පද්‍යය ලෝවැඩ සඟරාවේ පද්‍ය දෙකක් සිහිපත් කරයි.

| | |
|---|---|
| පණ නම් තණ අග පිනි බිඳු වැන් | නේ - පද්‍ය |
| අද අද එයි මරු පින් කර ගන් | නේ |
| කුමට ද කුසලට කම්මැලි වන් | නේ. - පද්‍ය 28[11] |

පුද්ගලයා කුශලයට යොමු කිරීම සාධු ජනයාගේ සත්කාර්යයකි. ඒ අනුව 'ධර්මචින්තා' කර්තෘ නාහිමි මුක්තිය උදෙසා පාඨකයාට කුසල් සිදු කරන ලෙස වඩ වඩාත් අවධාරණය කරයි. මේ ඊට නිදර්ශනයෝ ය.

තස්මාඡිවාර්ථං කුශලං චිනෝතු (පද්‍ය 65)
චිනෝතු තස්මාත් කුශලං ශිවාවහත්. (පද්‍ය 66)
තස්මාඡිවාර්ථං කුශලං චිනෝතු. (පද්‍ය 67)
චිනෝතු තස්මාත් කුශලං ශිවාවහත්. (පද්‍ය 68 හා 69
...... තස්මාත් කුශලං චිනෝතු. (පද්‍ය 70)
එහෙයින් නිවන් පිණිස කුසල් රැස් කෙරේවා.

ග්‍රන්ථයේ අවසාන කොටස් ධර්ම ආකරයකි. එහිදී කර්තෘ නාහිමි දශකුශල ධර්ම, දශ පාරමිතා, ධර්මරත්නයේ ගුණ, චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ටාංගික මාර්ගය හා සෝවාන් ආදී චතුර්විධ ආර්ය පුද්ගලයන් හා ඒ තත්ත්වයන්ගේ වටිනාකම් පෙන්වා දේ.

**යශෝධරාචරිතම්:**

ව්‍යවහාර වර්ෂ 2000 දී නුගේගොඩ, පුරාණ ග්‍රන්ථ සමාගම විසින් ප්‍රකාශයට පත් කොට ඇති 'යශෝධරාචරිතම්' කාව්‍යය කර්තෘ නාහිමි විසින් ඕස්ට්‍රේලියාවේදී[12] රචනා කරන ලද්දක් බව කර්තෘ සංදර්ශනයේ සඳහන් වේ.

ග්‍රන්ථයේ ප්‍රධාන කාව්‍යයට අයත් පද්‍ය සංඛ්‍යාව 369 ක් වන අතර එය පරිච්ඡේද සයකට වර්ග කොට ඇත. ඒ මෙසේය.

1 පරිච්ඡේදය- සිදුහත් කුමරු ගිහි ගෙයින් නික්මීම හා යශෝධරා දේවිය වේදනාවට පත්වීම (පද්‍ය 107 කි)

2 පරිච්ඡේදය- සුද්ධෝදන රජුගේ සතර පෙර නිමිති හා ගිහි ජීවිතයේ දුඃඛතාව පිළිබඳ අනුශාසනාව (පද්‍ය 27 කි)

3 පරිච්ඡේදය- යශෝධරා දේවියගේ විලාපය හා ප්‍රජාපතියගේ ශාන්ත ප්‍රකාශ (පද්‍ය 58 කි)

4 පරිච්ඡේදය- සිදුහත් කුමරු අනෝමා ගං තෙරට පැමිණීම හා සටීකාර බ්‍රාහ්මණගේ පරිෂ්කාර පූජාව (පද්‍ය 53 කි)

5 පරිච්ඡේදය- සිදුහත්ගේ ප්‍රව්‍රජ්‍යාව, දුෂ්කර ක්‍රියාව, බුද්ධත්වය හා ධර්මචක්‍රප්‍රවර්තන දේශනය (පද්‍ය 61 කි)

6 පරිච්ඡේදය- ධර්ම ප්‍රචාරය, බුදුරදුන්ගේ කිඹුල්වත් පුර සම්ප්‍රාප්තිය හා යශෝධරාගේ ප්‍රව්‍රජ්‍යාව (පද්‍ය 63 කි) වශයෙනි.

යශෝධරා චරිතය බෞද්ධ සාහිත්‍යයේ ඉතා ප්‍රකට වූවකි. ඒ සඳහා සිංහල යශෝධරාවත, සඳකිඳුරුදා කව, සංස්කෘත බුද්ධචරිත මහා කාව්‍යය හා පාළියේ ජාතකට්ඨකථා නිදර්ශන වශයෙන් දැක්විය හැක. එසේ වුව ද කර්තෘ නාහිමි කවි



කල්පනාවක් ලෙස නැවුම් ආකාරයෙන් මේ කාව්‍යය ඉදිරිපත් කරන බව ග්‍රන්ථයේ 'පෙරවදනේ' සඳහන් කරයි.[13]

''මේ කාව්‍යය පැරණි යශෝධරා චරිතය හා නො සැසඳෙනවා ඇත. එහෙයින් පාඨකයින්ට නො රුස්නක් විය හැකිය. එහෙත් මෙය මගේ කවි කල්පිත යශෝධරා චරිතයකි''.

මේ පිළිබඳව විමසීමක් කළ යුතුව ඇත. සිදුහත් කුමරු අභිනිෂ්ක්‍රමණය කළ පසු යශෝධරා කීප දෙනෙකුගෙන් කුමරු පිළිබඳව විමසීමක් කරයි. දොරටු පාලක, සේවිකාව, ඇතොවුර රක්නා සේවකයා හා උද්‍යාන පාලක ආදීහු ඇයට තොරතුරු ලබා දෙති. ඒ අතර උද්‍යාන පාලකගේ පැහැදිලි කිරීම සාම්ප්‍රදායික සිදුහත් චරිතයේ දැකිය නොහැකි තත්වයක් ඉස්මතු කොට දැක්වීමකි. එනම් කෘශාගෝතමිය (කිසාගෝතමී) හා සිදුහත් අතර පැවතීයැයි අනුමාන කෙරෙන ප්‍රේම සම්බන්ධතාවයි. එය සජ්ජනයන් විසින් පිළිනොගත් කට කථාවකි. ප්‍රවාදයකි. කෘශාගෝතමිය සිදුහත් කුමරුට කරන ප්‍රේමාන්විත ආයාචනය පෘථග්ජන ලෝකයට අමුත්තක් නොවනු ඇත. නිද:

දදෞ න කස්මෛචිදපි ස්පෘහාං පුරා
මමේඞ්ගිතං වා ප්‍රණයං මිථෝ'පි වා
න චාපි චික්ලේෂ පරෝ'පි මේ වපුඃ
භවාන් භවේද්ධි ප්‍රථමෝ මයාදෘතඃ. (පද්‍ය 79)

'මීට ඉස්සර මගේ කැමැත්තක්, ඉඟියක්, ආදරයක් රහසේවත් කිසිවෙකුටත් කෙළේ නැත. මගේ ශරීරය අන්‍යයෙකු කෙලෙසුවේ නැත. මා ආදරය කළ පළමුවැන්නා ඔබයි'.

මමාභිරාමාවසථස්‍ය ගෝපුරේ
න දර්ශකා වා හසකාශ්ච සම්ප්‍රති
පිතා ච මාතානුචරාඃශ්ච සේවකා
න සන්ති ගේහේ චටකෝ'පි මක්ෂිකා. (පද්‍ය 80)

'මගේ ගෙදර දොරටුවෙහි මුරකාරයන් හෝ බල්ලන් ද දැන් නැත. ගෙහි මව්පියන් හා මා පසුපස යන්නන් ද සේවකයන් ද ගේ කුරුල්ලෙකු ද මැස්සෙකු ද නැත'. මෙය සාම්ප්‍රදායික සිද්ධාර්ථ හා කිසාගෝතමී චරිතය නව ආකාරයකින් ඉදිරිපත් කිරීමකි.

දෙවැනි පරිච්ඡේදයේ වෙන් වන්නේ යශෝධරා හා සුද්ධෝදන අතර පවත්නා සංවාදයක් සඳහා වන අතර එහිදී සුද්ධෝදන රජුගේ ප්‍රකාශය සම්ප්‍රදායට එකඟ නොවනු ඇත. එනම් සතර පෙර නිමිති විස්තර කරන රජු ඉන් අනතුරුව ගිහි ජීවිතයේ පවත්නා අනේකවිධ භෞතික දුෂ්කරතාවන් විස්තර කරයි. රාජ්‍ය සම්පත් අනුභව කළ සුද්ධධෝදන රජු ගෘහස්ථ ජීවිතය පිළිබඳව එසේ කළ විස්තරයක් වෙනත් මූලාශ්‍රයක දැකිය නොහැක. කෙසේ වුව ද සිදුහත් කුමරු හිරු මෙන් තුන් ලොව ආලෝක කිරීමට උත්සාහවත් වූ බව[14] පවසා යශෝධරාගේ සිතෙහි දුක් නිවීමට උත්සාහ කරයි. සුද්ධෝදන රජුගේ උක්ත ප්‍රකාශය පෙළ දේශනාවට එකඟ නොවන්නකි.[15] එනම් දෙමාපියන් කඳුළු සළද්දී සිදුහත් කුමරු ගිහිගෙයින් නික්මුණු බව පෙළ සාහිත්‍යයේ දැක්වේ.

තෙවැනි පරිච්ඡේදයෙහි විස්තර කරනුයේ යශෝධරාවගේ චිත්ත සංතාපයයි. ඒ හා සමග ම නොයෙක් ආකාරයෙන් විවිධ තපස්වීන්ගේ චරිත අනුස්මරණය කරමින් යශෝධරා කරන ප්‍රකාශය පඤ්චකාමය පිළිබඳව පාඨක සිතිවිලි උසස් මට්ටමකට ගෙන ඒමට හේතු වනු ඇත. වෛශ්වානර ආත්ම භාවයේදී භාර්යාව සමග වන ගත වීම, ගෞතම ඍෂිවරයා අහල්‍යා සමග සබඳකම් පැවැත්වීම, මහේශ්වර දෙවිඳු උමාව සමග එක්වීම ආදී සිද්ධීන් යශෝධරාවගේ සිතට සැනසීමක් ලබාදීමට හේතු වනවා සේම පාඨක මනස අවබෝධයෙන් පූරණය කරවීමට ද හේතු වේයැයි සිතිය හැක.



සිව්වැනි පරිච්ඡේදය වෙන් වන්නේ සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණ අවස්ථාවේ නගරවාසීන් ප්‍රතිචාර දැක් වූ ආකාරය ගෙන හැර දැක්වීම සඳහාය. එසේ ම අනෝමා ගං තෙරින් එතෙරවීම, ඝටිකාර බ්‍රහ්මයාගේ අෂ්ට පරිෂ්කාර පූජාව ආදී සාම්ප්‍රදායික බුද්ධ චරිතයේ විස්තර සිහිපත් කරදේ. මෙම පරිච්ඡේදයට අනුව සිද්ධාර්ථ තවුසාණන් අභිනිෂ්ක්‍රමණය කොට ඇත්තේ උදෑසන කාලයේදීය. එනම් බොහෝ කාන්තාවන් ඇතුළු නගරවාසීන් තවුසාණන් පිළිගෙන තිබෙන නිසාවෙනි. එසේ ම මෙහිදී ඇතැම් කාන්තාවකගේ ශෘංගාරාත්මක චරිතය ද ගෙන හැර දැක්වීමට කර්තෘ නාහිමි අමතක කොට නැත.

රත්වා චිරං ඛේදගතා නිශායාං
කාචිද්වධූර්දර්පණවාමහස්තා
විලෝකමානාධරදන්තච්හ්නං
ද්‍රෂ්ටුං කුමාරං පුරතඃ ප්‍රපන්නා. (පද්‍ය 13)

'රාත්‍රියේ බොහෝ වේලාවක් රමණය කොට විඩාපත් කිසියම් ස්ත්‍රියක් වමතින් කැඩපත ගෙන තොල්වල දත් කැලැල් බලමින් කුමාරයා දැකීමට ඉදිරියට ආවාය'. මෙය කාලිදාස කෘත ඍතුසංහාර කාව්‍යයේ හේමන්ත නම් තෘතීය සර්ගයේ[16] බොහෝ සිද්ධි සිහිපත් කිරීමකි.

යශෝධරාචරිතම්හි පස්වැනි පරිච්ඡේදයෙන් විස්තර කරනුයේ සිද්ධාර්ථ තවුසාණන්ගේ ප්‍රව්‍රජ්‍යාව මෙන් ම භාර්ගව ආදි සෙසු තවුස්වරුන්ගෙන් විමෝක්ෂ දර්ශනය විමසන අවස්ථාව දැක්වීම සඳහාය. මෙහිදී මාර පරාජය කොට ත්‍රිවිද්‍යා ලබා සම්බුද්ධ ප්‍රාප්තිය හා සප්ත සප්තාහය ගත කළ අයුරු ද විස්තර වේ.

අවසාන සවැනි පරිච්ඡේදය ප්‍රථම ධර්ම දේශනය, කපිලපුරවර ගමන හා යශෝධරාවගේ ප්‍රව්‍රජ්‍යාව විස්තර කරයි.

පද්‍ය රචනයේදී මෙහි කර්තෘ නාහිමි සෞන්දරනන්ද කර්තෘවරයා මෙන් ඇතැම් අවස්ථාවන්හිදී ශබ්දාලංකාර පද

ද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යා

භාවිතය අමතක කොට නැත. ඒ සඳහා උන්වහන්සේ බහුලව යොදා ගෙන ඇත්තේ ව්‍යාකරණයේ සඳහන් ලිට් ලකාරයයි. සිද්ධාර්ථ කුමරු නිවසින් නික්ම ගොස් ඇති බව දැන ගත් යශෝධරා වැළපුන අයුරු කර්තෘ නාහිමි මෙසේ දක්වයි.

අතීතඩත් පාදතලේන භූතලං
ජජෘම්භ ඌර්ධ්වං විචකර්ෂ මූර්ධජම්
ජජල්ප වාක්‍යං විගතාර්ථමාකුලං
රුරාව හීතේව රුරෝද ගද්ගදම්. (පද්‍ය 1.10)

'පා පතුලෙන් පොළෝ තලයට ගැසුවාය. උඩට ඈනුම් ඇරියාය. හිස කෙස් ඇද්දාය. තේරුම් නැති වචන කොඳුලාය. බිය වූවක මෙන් කෑ ගැසුවාය. ගොත ගසමින් ඇඬුවාය'. මීට අමතරව කිඹුල්වත් පුරට බුදුරදුන් වැඩි අවස්ථාවේ යශෝධරාව උන්වහන්සේට මෙසේ ආදරය හා ගෞරවය ප්‍රකාශ කළාය.

ප්‍රණම්‍ය හර්ෂාතිශයේන ගෞතමී
නුනාව බුද්ධං නිපපාත භූතලේ
රුරෝද ජග්‍රාහ පදද්වයං මුනේඃ
සිෂේච බාෂ්පෛශ්ච නුනෝද දුර්මනඃ. (පද්‍ය 6.30)

'යශෝධරා අධික සන්තෝෂයෙන් වැඳ බුදුනට පැසසුවාය. පොළොවෙහි වැටුණාය. ඇඬුවාය. බුදුන්ගේ පා යුවල අල්වා ගත්තාය. කඳුලින් පා යුවල තෙමුවාය. ශෝකය දුරු කළාය'. මෙකී පද්‍යයත් සෞන්දරනන්ද මහා කාව්‍යයේ හා බුද්ධචරිත මහා කව්‍යයේ පද්‍යයන්[17] හා සන්සන්දනය කිරීමෙන් වඩා වැඩි අවබෝධයක් ලැබිය හැක.

සාම්ප්‍රදායික බුද්ධ චරිතය හා යශෝධරා චරිතය නවතාවකින් ඉදිරිපත් කිරීමට දවුල්දෙණ නාහිමි උත්සාහ දැරීම අගය කළ හැක. විශේෂයෙන් ම බුද්ධ චරිතය හා යශෝදරා චරිතය ලාංකික විද්වතෙකු විසින් සංස්කෘත භාෂාවෙන් රචනා කිරීම ඓතිහාසික සිද්ධියක් වීම නොවැළැක්විය හැක.

07 FEB 2014



මහාමහේන්ද්‍රක්ෂීණාශ්‍රවාගමනම්

ව්‍යවහාර වර්ෂ 2002 දී නුගේගොඩ, පැරණි පොත් සමාගමේ මුද්‍රණය කොට කර්තෘ ප්‍රකාශනයක් ලෙස ප්‍රකාශයට පත් කොට ඇති මෙම ග්‍රන්ථය සංස්කෘත පද්‍ය 31 කින් සමන්විත වූවකි. ග්‍රන්ථ අවසානයේ කර්තෘ සංදර්ශනය සුපුරුදු පරිදි තමන් පිළිබඳව කර්තෘ නාහිමි හඳුන්වා දෙන අතර උන්වහන්සේගේ 87 වැනි ජන්ම සංවත්සරයේදී මෙය රචනා කළ බව කියවේ. (අශීතිසප්තමේ වර්ෂේ ජන්මනෝ හෘෂ්ටමානසඃ). එසේ ම මෙම ග්‍රන්ථය ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අනුමැතිය[18] මත රචනා කළ බව ද එහි සඳහන් කොට ඇත.[19]

ග්‍රන්ථය එක්වරම ආරම්භ වන්නේ තිස්ස රජු විසින් පෙර නොදුටු විරූ මිනිස් රුවක් දැකීමෙනි. අනතුරුව මහා මහේන්ද්‍ර ක්ෂීණාශ්‍රවයාණන්ගේ රශ්මි මාලාව දුටු තිස්ස රජු සිතිවිලි සයුරක ගිළිණි. මීට ප්‍රත්‍යුත්තර දුන් මහේන්ද්‍රයාණෝ මෙසේ ප්‍රකාශ කළහ.

ගුරෝස්ත්‍රිලෝකේ ජිතමාරවිද්විෂෝ
භවාමි ශිෂ්‍යශ්‍රමණඃ ක්ෂතාශ්‍රවඃ
අශෝකරාජස්‍ය ච චක්‍රවර්තිනඃ
සුතෝ'ස්මි ජම්බුශ්‍රුතදේශජෝ නෘප. (පද්‍ය 10)

'රජතුමණි, මම මරුන් දිනූ තිලෝගුරුන්ගේ කෙලෙසුන් නැසූ පැවිදි සිසුවෙක්මි. දඹදිව උපන් මම සක්විති අශෝක රජුගේ පුතා ද වෙමි'.

අනුඥයා තේ සුහෘදශ්ච මේ ගුරෝ
ස්තව ප්‍රජානාඤ්ච හිතාය සම්ප්‍රති
උපාගතෝ'හං ජිනධර්මදිත්සයා
මහේන්ද්‍රනාමාස්මි මුනීන්ද්‍රනන්දනඃ. (පද්‍ය 11)

'ඔබගේ මිතුරාගේ සහ මගේ ගුරුතුමාගේ ද නියමයෙන් ඔබගේ සහ රටවැසියාගේ ද යහපත පිණිස බුදුන්ගේ දහම්

දෙසීමට පැමිණි මම බුදුපුත් 'මිහිඳු' නම්'. මෙම ප්‍රකාශය ශ්‍රවණය වන විට ශ්‍රී ලාංකිකයාට සිහිපත් වන්නේ ඉතා සුප්‍රකට මහාවංස කතුරයාගේ ප්‍රකාශයයි. එනම්

සමණා මයං මහාරාජ - ධම්මරාජස්ස සාවකා
තවේව අනුකම්පාය - ජම්බුදීපා ඉධාගතා. (14.8)[20]

මෙම පාලි පද්‍යයේ 'මයං' හා සංස්කෘත පද්‍යයේ 'අහං' යන උක්ත පදයන්හි අන්තරයක් පෙණුන ද මෙම සංස්කෘත පද්‍යයේ එම භාවිතය වඩා සුදුසු සේ යෙදීමක් බව පෙනේ. එනම් ග්‍රන්ථයට අනුව පළමුව පෙනී සිටියේ මිහිඳු මහරහතන් වහන්සේ පමණි. දෙවැනි අවස්ථාවේදී රජු විමසිලිමත් වූ විට මිහිඳු තෙරුන් විසින් සෙසු පිරිවර ද දැක්වන ලදි. එය ආගමික වශයෙන් ආධ්‍යාත්මික ශක්තිතාව ප්‍රකට වීමක් වන අතර සාහිත්‍යාත්මක වශයෙන් නාට්‍යාකෘතියක්[21] සේ සැලකිය හැක.

මෙම ග්‍රන්ථයේ අවසානය සඳහන් වන්නේ අනුලා දේවියගේ ප්‍රථම මාර්ගය හා ඵලාගමයෙනි.

යතිපතිගදිතාග්‍රං ධර්මමාකර්ණ්‍ය සම්‍යක්
ත්‍රිශරණගතබෞද්ධාස්තේ බහුවඃ සමග්‍රාඃ
සපරිජනකුලස්ත්‍රී සානුලා රාජදේවී
ප්‍රථමමධිගතා නිර්වාණමාර්ගං ඵලඤ්ච. (පද්‍ය 31)

'යතීන්ද්‍රයන් වහන්සේ විසින් දෙසූ අනගි දහම් අසා ඒ සියලු දෙනා ම තිසරණ ගත බෞද්ධයෝ වූහ. පිරිවර වූ කුලගනන් සහිත අනුලා දේවිය සෝවාන් වූවාය'.

සාම්ප්‍රදායික වශයෙන් බලන විට මෙහි අන්තර්ගතයේ වෙනසක් දැකිය නොහැක. එහෙත් ශ්‍රී ලාංකික සංස්කෘත සාහිත්‍යය වශයෙන් මෙය අගය කළ හැකි ව්‍යායාමයකි.



**සර්වේ සංස්කාරා විපරිණාමධර්මාඃ**

නුගේගොඩ, මොඩර්න් පොත් සමාගමේ මුද්‍රණය කරන ලද උක්ත කෘතිය 2007 වර්ෂයේදී ප්‍රථම වරට ප්‍රකාශයට පත් විය. මෙ තුළින් සියලු සංස්කාර ධර්මයන්ගේ විනශ්වර ස්වභාවය පිළිබඳ පාඨකයාට අවබෝධයක් ලබා දීමට කර්තෘ නාහිමියෝ උත්සාහ දරති. උන්වහන්සේ ග්‍රන්ථයේ හැඳින්වීමේදී මෙවැනි කෘතියක් කිරීමට හේතුව මෙසේ පැහැදිලි කරති.

''මම උපතින් 93 වන වියට පියවර තැබීමි. මහලු වියෙහි දැනට විඳින දුක් පීඩන ගමන බිමනේදීත් විවේක අවස්ථාවන්හිදීත් සංස්කෘත පද්‍යයෙන් රචනා කිරීම මට මනෝ විනෝදයක් විය. මේ එහි ප්‍රතිඵලයයි''.[22]

මෙහි පද්‍ය ප්‍රමාණය 111 කි. ඊට අමතරව ග්‍රන්ථාවසානයේ කර්තෘ සංදර්ශනය ඉදිරිපත් කොට ඇත. එහි පද්‍ය සංඛ්‍යාව තුනකි. උක්ත ශතකෝත්තර ඒකාදශ පද්‍ය ප්‍රමාණයෙහි වර්ගීකරණයක් ඇති බව ද ග්‍රන්ථ හැඳින්වීමේ සඳහන් වේ. ඒ මේ අයුරිනි.

- ප්‍රථම පද්‍යයේ සිට 45 වන පද්‍යය දක්වා ජීවන තොරතුරු සැකෙවින් දැක්වීම
- 46 වන පද්‍යයේ සිට 104 වැනි පද්‍යය දක්වා මහලු වයසේ ස්වභාවය දැක්වීම
- 104 වැනි පද්‍යයේ සිට 111 පද්‍යය දක්වා සසර සයුරින් එතෙර කරන ලෙස තුණුරුවන්ට ආයාචනා කිරීම වශයෙනි.

දවුල්දෙණ ඥානේශ්වර නාහිමියන්ගේ ජීවන තොරතුරු පිළිබඳ පුළුල් විස්තරයක් මෙහි සඳහන් වේ. ළමා කාලය, පැවිදි ජීවිතය, ග්‍රන්ථකරණය, ශාස්ත්‍රීය සේවා, තමන් විසින් ලබන ලද

විවිධ උපාධි යනාදි දීර්ඝ විස්තරයක් ඊට ඇතුළත් වේ. සෙසු භාෂාවන් අතර සංස්කෘත භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් උන්වහන්සේ විසින් දක්වා ඇති බැවින් විශේෂ සම්මාන රාශියක් ද උන්වහන්සේට පිරිනමා ඇත. කෙසේ වුව ද උන්වහන්සේ විසින් සංස්කෘත සාහිත්‍යය උදෙසා ඉමහත් සේවාවක් සිදු කොට ඇති බැවින් උන්වහන්සේගේ ජීවන තොරතුරු ඇතුළත් කිරීම අගය කළ හැක.

46 වැනි පද්‍යයේ සිට ආරම්භ කෙරෙන මහලු වයස පිළිබඳ විස්තරය අතිශය ඛේදනීය වේ. ඉන් පාඨකයා ජීවිතය පිළිබඳ විෂාදයට පත් කරනු ඇත. එහි ආරම්භය මෙසේය.

ඉදානිං පිශිතං භුක්ත්වා පායං පායඤ්ච ශෝණිතම්
නේයං නේයං කෘශත්වං මාං ශිශ්ලේෂාජගරී ජරා. (පද්‍ය 46)

'දැන් මස් කා ලේ බිබී සිරුර කෙට්ටු කරමින් ජරා නමැති පිඹුරිය මා වැළඳ ගත්තාය'. මෙසේ දීර්ඝ විස්තරයක් ජීවිතයේ අනිත්‍යත්වය හා විනශ්වරතාව පිළිබඳ ඉදිරිපත් කෙරේ. එහි අවසානය උන්වහන්සේ ධර්මානුකූලව නිගමනය කරති. නිදි:

ව්‍යසනාභිහතේ භවත්‍රයේ
න හි කිඤ්චිත් සුඛමස්ති ශාස්වතම්
මුනිනා ජගදේකබන්ධුනා
විදිතා නිර්වෘතිරේව සුස්ථිරා. (පද්‍ය 105)

'ව්‍යසනයන්ගෙන් යුත් තුන් ලොව සැපයක් හෝ ස්ථිරත්වයක් නැත. ලෝක බන්ධු වූ බුදුන් වදාළ නිවණ ම ස්ථිර දෙයකි. සැපයකි'.

උපමා රාශියක් ද භාවිත කරමින් තමන් වහන්සේගේ අභිප්‍රේතාර්ථය පාඨකයාට ඒත්තු ගැන්වීමට කර්තෘ නාහිමියන් දරන උත්සාහය ග්‍රන්ථ අලංකරණයට ද හේතු වේ. ඒවා සාමාන්‍ය අර්ථයන් සමග කීපයක් මෙසේය.



- කෘශ ශරීරය සුළඟින් සෙළවෙන කෙසෙල් ගසක් මෙනි. 'වාතාහතකදලීව වේපතේ කෘශවිග්‍රහඃ' (පද්‍ය 47)
- හිස ගෙල නමැති දණ්ඩේ යටිකුරු කළ කළ ගෙඩියකි. 'ශිරඃ ශිරෝධිදණ්ඩාග්‍රේ ත්වවාඞ්මුඛඝටෝපමම්'. (පද්‍ය 58)
- කොපොල් යුග්මය සුළං නැති බෝල දෙකක් මෙනි. 'කපෝලයුග්මමේතර්හි නිර්වායුගේණ්ඩුකද්වයම්' (පද්‍ය 59)
- මෙකල (මුහුණ) ජරපත් සිවලෙකුගේ හොටයක් විය. 'අධුනා ජරශෘගාලස්‍ය තුණ්ඩසංකාශතාං යයෞ'. (පද්‍ය 60)
- සම් හා ඇට ඉතිරි වූ උකුල බිඳුණු කළගෙඩි කැල්ලකි. 'චර්මාස්ථිශේෂජඝනෝ භග්නකුම්භස්‍ය ඛණ්ඩවත්'. (පද්‍ය 61)
- (එකල) මිනිස්සු බඹරුන් අරවින්දයක් මෙන් පා දෙක සේවනය කළහ. 'භෘඞ්ගා යථා ශතපත්‍රං පාදයුග්මං මහාජනාඃ'. (පද්‍ය 63)
- මෙකල ඒ පා දෙක බකමූණු පියාපත් දෙකක් මෙනි. 'අධුනා ජතුකාපක්ෂසංකාශං තත් පදද්වයම්'. (පද්‍ය 64)
- (මෙකල දන දෙක) පොල් කටු දෙකක් මෙනි. 'නාරිකේලඵලේ සදෘඃ කණ්ඨකද්වයසන්නිභේ'. (පද්‍ය 65)
- (සිරුර) වැරහැල්ලෙන් වෙළූ පඹරුපයක් මෙනි. 'පටච්චරානද්ධදාරුමයපුත්‍රකසන්නිභඃ'. (පද්‍ය 66)
- (උගුරේ) බකමූණු හඬ මෙන් ඉක්කාව නිතර පවතී. 'උලූකරවසංකාශහික්කා භූයඃ ප්‍රවර්තතේ'. (පද්‍ය 68)

ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
07 FEB 2014

- දිරුණු පපුව නිතර මයින හමක් මෙන් සුසුම්ලයි. 'ශාශ්වස්‍යතේ යථා භස්ත්‍රා ජීර්ණවක්ෂෝ මුහුර්මුහුඃ'. (පද්‍ය 75)

- අහෝ, ජලයෙන් ගොඩදැමූ මාළුන් මෙන් ඇඟිලි වෙව්ලයි. 'ජලෝත්ක්ෂිප්තා යථාඃ මීනාඃ කරශාඛාඃ චලන්ත්‍යහෝ'. (පද්‍ය 96)

- පියුම් පතක ජලය මෙන් හදවතේ සිහියක් නැත. 'න වර්තතේ හෘදිස්මෘතිඃ පද්මපත්‍රේ ජලං යථා'. (පද්‍ය 97)

ග්‍රන්ථ කර්තෘ නාහිමි සසර සයුරින් එතෙර වීමට මහත් උත්සාහයක් දරයි. ඒ සඳහා ග්‍රන්ථයේ අවසාන පද්‍ය රාශියක් බුදුගුණ වර්ණනා කරමින් යොදා ගෙන ඇත. සැම පද්‍යයක ම දක්නා ලැබෙන එම ප්‍රකාශය බුද්ධ භක්තිය දනවන්නකි. නිදː

- බුදුරදුනි, සසරින් එතෙර වීමට මට පිහිට වන්න. 'ශරණං මම භවතාද්දශබලවාන් භවතරණේ'. (පද්‍ය 106)

- උත්තමයාණනි, නිවනට යාමට පිහිට වන්න. 'පාරං ශිවං භව භවන් ශරණං ප්‍රයාතුං'. (පද්‍ය 107)

- ජාති දුක්ඛයෙන් විනාශ වූ ත්‍රිභව සයුරෙන් එතෙර වීමට මම වඳිමි. වඳිමි. 'වන්දේ වන්දේ තිතීර්ෂුස්ත්‍රිභවජලනිධි ජාතිදුඃඛාදිභඞ්ගම්'. (පද්‍ය 108)

- දශබලධාරී භාග්‍යවතුනි, මට නිවන දෙන්න. 'භගවාන් දශබලවාන් විතරතු මේ ශිවමමෘතම්'. (පද්‍ය 109)

- සදා සුවැති නිවනට යාමට මට පිහිට වන්න. 'නිර්වාණක්ෂේමභූමිං මම භව ශරණං යාතුමත්‍යන්තසෞඛ්‍යම්'. (පද්‍ය 110)

- නොයෙක් දුක්ඛයෙන් තැවුණහුට සසර සයුර තරණය කිරීමට පිහිට වන්න. 'සංසාරාබ්ධිං තරීතුං භවතු හි ශරණං නෛකදුඃඛාර්දිතස්‍ය'. (පද්‍ය 111)



භෞතික වූ සියල්ල වෙනස් වන බව පෙන්වීම මේ කෘතියේ මුඛ්‍ය උද්දේශය වූ බව තත් කෘතියේ නාමයෙන් වුව ද පැහැදිලි වේ. නිර්වාණය ම එක ම ශාන්තිය බව මෙහි අවධාරණය කෙරේ.

**යතිදූතම්ː**

මෙම ග්‍රන්ථය ශ්‍රී ලංකාවේ රචිත දූත කාව්‍යයකි. මේ සඳහා පාදක කොට ගෙන ඇත්තේ භාරතයේ සම්පාදිත දූත කාව්‍ය සම්ප්‍රදායයි. භාරතයේ ප්‍රකට දූත කාව්‍යත්‍රයක් ගැන දැනගන්නට ලැබේ. එනම් 'හංසදූත, පවනදූත හා මේඝදූත' වශයෙනි. ඒ අතුරින් කාලිදාස විරචිත මේඝදූත කාව්‍යය ඉතා ප්‍රකට වේ. සම්භාවිත වේ. පූර්වතන කවීහු දූත කාව්‍යයක ලක්ෂණ මෙසේ දක්වති.

- ප්‍රසිද්ධං නායකී කෘත්‍ය පුරුෂං වාථ යෝෂිතම්
  සන්දේශං ප්‍රෙෂයේද් විද්වාන් දූතෛර් වංශාදිභිඃ ශුභෛඃ.

- ඉතිහාස කථාපූර්වමාශීඃ පූර්වමථාපි වා
  දූතං තු වර්ණයේදාදෞ කුශලප්‍රශ්නපූර්වකම්

- වර්ණනාන්තරං තස්‍ය ගන්තව්‍යස්ථාන කීර්තනම්
  පශ්චාත් තච්ඡ්‍රෝෂ්‍යතීත්‍යුක්ත්වා මාර්ගදේශාදි
  වර්ණයේත්.

- තතස්තද්දේශනගරී නායකානාං ගුණස්තුතිඃ
  තතෝ වෘත්තාන්තකථනං දූතස්‍යාශිර්වචඃ පරම්.

අතිපූජ්‍ය දවුල්දෙණ ඥාණිස්සර නාහිමි විසින් රචිත මේ දූත කාව්‍යයේ අරමුණ වූයේ රටේ පැවැති ත්‍රස්තවාදී ප්‍රශ්නය (පද්‍ය 228 සිට237) දුරු කිරීම සඳහා සත් දිනක් පිරිත් දෙසුමක් පවත්වා සම්බුද්ධ ශාසනයත් මහා ජනයාත් ආරක්ෂා කිරීමට ලෝක ආරක්ෂක දෙවිවරුන්ට සංඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලීම සඳහාය. මෙය සමකාලීනව රටේ පැවැති ප්‍රශ්නයකි. එහිදී ත්‍රස්තවාදීන් විසින් සිදු කළ විනාශය මෙසේ සඳහන් වේ.

විහාරදේවායතනානි තේ බලාඃ -
ප්‍රභඤ්ජ්ඣ් පූජ්‍යාන් යතිනෝ යතේන්ද්‍රියාන්
හතාදහෝ බෝධිමහීරුහාං ගණං -
සමූලමුද්ධෘත්‍ය කුරුස්ව හස්මසාත්. (233 පද්‍යය)

'ඒ අධමයෝ විහාර දේවාල බිඳ දැමූහ. පූජනීය භික්ෂූන් මරා දැමූහ. අනේ, බෝධි වෘක්ෂ සමූහය මුලිනුපුටා හලු කළහ'.

මෙම සන්දේශ කාව්‍යයේ ප්‍රේෂක, හාරක හා ග්‍රාහක තිදෙනා ම භික්ෂූහු වෙති. ඒ නිසා මේ කාව්‍යය 'යතිදූතම්' වේ. දූතයා භික්ෂුවක් වන අතර (පද්‍ය 01 සිට 05) සන්දේශය බාර දෙනුයේ කොළඹ විද්‍යෝදය පරිවේණාධිපති අකුරැටියේ අමරවංශ නාහිමියන් (පද්‍ය 222 සිට 227) වෙතය. උන්වහන්සේ විසින් සංඝාඥාව නිකුත් කළ යුතු වේ. එය මෙසේය.

ඉත්ථං කෘත්වා පුනර් භෝඃ ප්‍රවර යතිපතේ බණ්ඩශෝ
නෛව හඞ්ක්ත්වා
ලඞ්කාද්වීපඤ්ච තස්මින්නඛිලජනගණං රක්ෂිතුං ශාසනඤ්ච
බ්‍රහ්මේන්ද්‍රෝපේන්ද්‍රනාථ ප්‍රමුඛදිවිෂදාං
ලෝකසංරක්ෂකාණාං
සඞ්ඝාඥප්තිං විධාතුං ප්‍රණමිතශිරසා ත්වාමහං සම්ප්‍රයාචේ.
(237 පද්‍යය)

'නාහිමිපාණන් වහන්ස, මෙසේ සිදු කර නැවත කැබැලි වශයෙන් නොකඩා ශ්‍රී ලංකා ද්වීපය ද එහි සියලු ජන සමූහය ද ශාසනය ද ආරක්ෂා කරන ලෙස ලෝ රක්නා බ්‍රහ්ම, ඉන්ද්‍ර, උපේන්ද්‍ර, නාථ ආදී දෙවිවරුන්ට සංඝාඥාවක් නිකුත් කරන ලෙස නමස්කාර පෙරටුව මම ඔබ වහන්සේගෙන් අයැද සිටිමි'.

මෙහි පද්‍ය සංඛ්‍යාව 238 කි. දූතයා ගමන ආරම්භ කරණුයේ උඩරට ගමක් වූ සපුගොල්ල නම් ගමෙනි. එහි තපෝධනාරාම විහාරයේදී බුදුන් වැඳ ගමන් අරඹන දූතයා කොළඹ විද්‍යෝදය පිරිවෙණ දක්වා පැමිණේ. දූතයා පැමිණෙන ගමනේදී දක්නට ලැබුණු හා මුණගැසුණු තෙරවරුන් පිළිබඳ විස්තරයක් සපයා ඇත.



මේ දූත කාව්‍යයේ තවත් විශේෂ ලක්ෂණයක් නම් සිංහල නාම සඳහා සංස්කෘත නාම භාවිත කොට තිබීමයි. නිදඃ වැලිමඩ-වාලුකාමණ්ඩ, හක්ගලකන්ද-සංඛශෛල, සීතාඑළිය-සීතාලෝක, නුවරඑළිය-නගරාඞ්ගණ, පිදුරුතලාගල-පලාලතල අද්‍රි, විදුරුපල-වජ්‍රෝපල, සමනොළකන්ද-සමන්තාද්‍රිකූට, මහවැලිගඟ-පෘථුවාලුකා නදී, ගම්පල-ගංගෝපල, සිරි සෙංකඩගල-ශ්‍රී ක්ෂේමකාණ්ඩගිරි, කජුගම-කජ්ජුග්‍රාම, යක්කල-යක්ෂශාලා, දැදිගම-ජාතිග්‍රාම, හපුතලය-චම්පක තල ආදී වශයෙනි.

## ශතක කාව්‍යයෝ

විවිධ වෘත්තවලින් යුත් ප්‍රබන්ධ කාව්‍ය සම්ප්‍රදායක් සංස්කෘත සාහිත්‍යයේ දක්නට හැක. ඒ ඉතා ඉපැරණි වූද, රසවත් වූ ද 'ශතක' කාව්‍ය සම්ප්‍රදායයි. සංස්කෘත ශතක සාහිත්‍යයේ ආරම්භය පිළිබඳ එක් එල්ලේ දින වකවානු නියම කළ නොහැක. එසේ වුව ද ක්‍රි.ව. පළමු ශත වර්ෂය තරම් ඈතට එහි ඉතිහාසය දිව යන බව ඇතැමෙක් පෙන්වා දෙති. සමහරෙකුගේ මතය වන්නේ වෛදික යුගය තරම් ඈතට ඉතිහාසය දිව යන බවකි. කෙසේ වුව ද මේ ග්‍රන්ථයන්හි අන්තර්ගතය ඉතා පැරණි වුව ද ග්‍රන්ථ ආකෘතිය හා නිර්මාණය මෑත කාලයට අයත් වන බව පෙනේ. එවැනි ශතක ග්‍රන්ථයන්ගේ ප්‍රාදුර්භාවය කෙසේ සිදුවීදැයි ජයදේව තිලකසිරි මහතා මෙසේ සඳහන් කරයි.

''මහා කාව්‍ය රීතියට ගැති නොවී ස්වතන්ත්‍රව මේඝදූතයේ ආකාරයට කාව්‍යයක් සම්පාදනය කිරීමේ අගය කාලිදාසයෝ පැහැදිලි කරදුන්හ. තවත් ක්‍රමයක් අනුව ස්තෝත්‍රයක ආකාරයෙන් හෝ විවිධ විෂයයන් මාතෘකා වශයෙන් ගෙන හෝ පද්‍ය සියයකින් පමණ යුත් 'ශතකයක්' සකස් කිරීම එතරම් ප්‍රතිභාවක් නොවූ කවීන්ට රුචි විය''.[23]

මහාකාව්‍ය රචනය සඳහා විශාල කාලයක් හා ශ්‍රමයක් කැප කරන්නට සිදු වූ හෙයින් ස්වාධීන කවීන්ට නිදහස් ආකාරයේ කාව්‍ය රචනා කෙරෙහි අවධානය යොමු කරන්නට සිදු විණැයි

කල්පනා කළ හැක. ජයදේව තිලකසිරි මහතා සඳහන් කරන පරිදි කාලිදාස වැනි කවීන් මේඝදූතය වැනි කාව්‍ය රචනා කිරීමෙන් මේ සඳහා පසුබිම ඒ වන විටත් සකස් කොට තිබිණ යන ප්‍රකාශය සමග තවත් හේතු රාශියක් ද බලපාන්නට ඇත. එනම් රාජ මන්දිරයන්හි හිටිවනම ස්තෝත්‍ර හෝ ශ්ලෝක ගායනා කිරීමේ පුරුද්දක් ද අතීත භාරතයේ වූ බව පෙනේ. රාජ කවීන් අතර පැවැති ශ්ලෝක ගායනා කිරීමේ තරගකාරිත්වය 'නිදහස් කාව්‍ය' බිහිවීමට තවත් හේතු වන්නට ඇත. මෙසේ නිදහස් රචකයන් හා ඒ සඳහා වූ තරගකාරිත්වය 'ශතක' කාව්‍යයේ ආරම්භය ලෙස අනුමාන කළ හැක. ශතක කාව්‍යයන් අතර දවුල්දෙණ ඥානේශ්වර නාහිමියන්ගේ ඉහත සඳහන් මාරාඞ්ගනා විජයම් හා ශ්වානස්තව කාව්‍යම් යන කෘති ද්වය පිළිබඳ විමසා බැලිය යුත්තකි. එය වර්තමාන ශ්‍රී ලංකාවේ සංස්කෘත සාහිත්‍යය ප්‍රබෝධයට ඉමහත් පිටුබලයක් වී ඇත.

මෙම කාව්‍යයන්හි භාව ගීතයන් ඇතුළත් වන බැවින් මෙම සාහිත්‍යය 'ඛණ්ඩ කාව්‍ය' සමූහයට ඇතුළත් කොට ද සැලකේ. එසේම මෙම ග්‍රන්ථ වංශයෙන් අරමුණු කීපයක් සාක්ෂාත් කළ බැවින් අංශ කිහිපයක් ඔස්සේ ග්‍රන්ථ රචනය සිදුවිය. එනම්

- උපදේශාත්මක ශතක කාව්‍ය
- ශෘංගාරාත්මක ශතක කාව්‍ය
- ස්තෝත්‍ර ශතක කාව්‍ය ආදී වශයෙනි.

යට දක් වූ විවිධ අංශයන් මගින් අරමුණු කීපයක් සාක්ෂාත් කිරීමට කතුවරුන් උත්සාහ කළ බව කිව හැක. එනම්

- සමාජයේ යහ පැවැත්ම උදෙසා උපදේශ ලබාදීම
- ආගමික හා ධාර්මික ලෙස පුද්ගලයා පෝෂණය කිරීම
- දේව භක්තිය හා දේව ආශිර්වාදය අපේක්ෂා කිරීම
- ලෞකික ජීවිතයට තෘප්තිය ලබාදීම (ශෘංගාර ආදී) වශයෙනි.



මෙම නාහිමියන්ගේ මාරගඞ්ගනා විජයම් හා ශ්වානස්තව කාව්‍යම් යන ශතක ද්වය අරමුණු දෙකක් සාර්ථක කරගැනීමට ප්‍රධාන වශයෙන් අපේක්ෂා කළ බව පෙනේ. 'මාරාඞ්ගනා විජයම්' ශතකයෙන් බුදුරදුන් මරඟනන් පරාජයට පත් කොට ජයග්‍රහණය කළ අයුරු විස්තර වේ. මෙහි ශෘංගාරාත්මක කාව්‍යයක ස්වරූපය පෙන්නුම් කළ ද අවසාන වශයෙන් දැකිය හැක්කේ ආගමික හා ධාර්මික ලෙස පුද්ගලයා පෝෂණය කිරීමයි. නැතහොත් 'බුද්ධ භක්තිය' වර්ධනය කිරීමයි. අනෙක් අතට 'ශ්වානස්තව කාව්‍යයේ' ප්‍රධාන අරමුණ වූයේ බල්ලා ළඟ ඇති ආදර්ශවත් උතුම් ගති බිඳක් ප්‍රශංසාවට ලක් කිරීම බව කර්තෘ හිමියෝ පෙන්වා දෙති. ඉන් අපේක්ෂා කරන්නට ඇත්තේ මානව සමාජයේ යහ පැවැත්ම උදෙසා සුනඛ චරිතය ආශ්‍රයෙන් සදුපදේශයන් ලබාදීමයි. මේ අනුව ග්‍රන්ථ ද්වය පිළිබඳ විමසා බැලීම වටී.

## මාරාඞ්ගනා විජයම්

1983 දී ප්‍රථම වරට මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කොට ඇති මේ ග්‍රන්ථය විවිධ වෘත්තයන්ගෙන් යුක්තය. පෙර කී ලෙස බුදුරදුන් මරඟනන් පරදා බුදුබවට පත් වූ අයුරු මෙහි විස්තර වේ. ග්‍රන්ථයේ කර්තෘවරයා පිළිබඳව 'කර්තෘ සන්දර්ශනම්'හිදී මෙසේ හඳුන්වයි.

> දවුල්දෙණග්‍රාමජාතඥානේශ්වරයතීශ්වරඃ
> මාරාඞ්ගනාවිජයාඛ්‍යං ප්‍රබන්ධං කෘතවානිමම්.

'දවුල්දෙණ ග්‍රාමයේ උපන් ඥානේශ්වර යතිඳු මාරාඞ්ගනා විජය නම් මෙම ප්‍රබන්ධය කළේය' යනු එහි අර්ථයයි. යතීශ්වරයෙක් වන කර්තෘ නාහිමි මරඟනන්ගේ රංගනය මනා ලෙස මතු කොට දක්වයි.

ඒකා මඤ්ජුලතූර්යවිශේෂං වීණාමන්‍යා සනමපරා
නාදයතේ මධු ගායති කාචිත් නෘත්‍යති කාචන ප්‍රතිනිනදම්.
(පද්‍ය 06)

'එකියක් මනහර තූර්ය වර්ගයක් වයයි. තවත් එකියක් වීණාවක් වයයි. අනික් එකියත් මිහිර ලෙසින් ගයයි. තවත් එකියක් තාලයට නටයි'. මෙලෙසින් ශෘංගාර රසය ද කැටි කරමින් මේ ග්‍රන්ථය ඉදිරිපත් කිරීමට මේ හිමි දක්ෂ වී ඇත. මේ සඳහා තවත් නිදර්ශන කීපයක් ම දැක්විය හැක.

සමුදිතවදනා තරලිතරශනා පුරතඃ පරතෝ විනිහිතචරණා
වටතරුනිකටෙ මෘදුසිතශිකතේ කේලිපරා කාචිද්වනිතා
මුඛරිතවලයං වරකරයුගලං මුහුරපි මුහුරපි කම්පයති
විකසිතනයනා කිඤ්චිත් කුටිලං පශ්‍යති මුනිමුඛසරසිරුහම්.
(පද්‍ය 07)

'සුන්දර මුහුණ ඇති එක් වනිතාවක් සුන්දර පහතට හෙළූ රසනා දාමය ඇත්තේ පෙරටත් පසුපසටත් පා තැබුයේ ඇසතු ගස් සමීපයේ මොළොක් සුදු වැල්ලේ රඟ දෙන්නී වළලු නද දෙන පැහැපත් දෑත් යුවල සෑම මොහොතක රඟ දෙවයි. දිදුලන ඇස් ඇත්තී මුනිවරයාගේ මුව පියුම මදක් අඩවන්ව බලයි'.

මුහුස්තිෂ්ඨති මුහුර් නිපතති පුනස්තිෂ්ඨති සස්මිතං
චලද්විලසත් තඩිද්වත් කරයුගං යුගපත් කම්පතේ
ඩමඩ් ඩමමනුරාවමසකෘත් පදං නිපතති භූතලේ
පුනඃ පුනරපි වදනකමලං මුනේඃ කාචිද් වීක්ෂතේ. (පද්‍ය 14)

'මොහොතක් සිටී. මොහොතක් හොවී. නැවතත් සිනාවෙන් නැඟී සිටී. සැලෙමින්, දිදුළමින් විදුලියක මෙන් දෙඅත් යුග එක්වර ම රඟ දෙවයි. ඩමඩ් ඩමඩ් නම් රාවය නගමින් බහුලව බිම වැටේ. එකියක් නැවත නැවතත් මුනිවරයාගේ මුව පියුම දෙස බලයි'.



ව්‍යපහාය නිරර්ථභාවනා
මහිරන්තුං රහසා යථාරුචි
නිකටොපවනේ ලතාගෘහේ
ශයීයං ව්‍රජතාන්මයා සහ. (පද්‍ය 27)

'අර්ථ රහිත භාවනාව අත්හැර රහසින් සිත් සේ රමණය කරන්නට ළඟපාත උයනේ ලිය මඬුල්ලේ යහනාවට මා සමග එන්න'. එක් මාරාංගනාවක් ගෞතමයන්ට ආරාධනා කරයි. ඇය තවදුරටත් තවුසන් පොළඹවන්නට මෙසේ කියයි.

රාජ්‍යශ්‍රියං ප්‍රාණසමාඤ්ච දේවිං
යශෝධරාඤ්චාපි සුතං ප්‍රජාඤ්ච
ත්‍යක්ත්ත්වාධුනා නිර්ජනකානනේ'ස්මින්
නභෝ භවාන් කිං කුරුතේ නිෂද්‍ය. (පද්‍ය 88)

'රාජ්‍ය සම්පත් ද, ප්‍රාණ සම යශෝධරා දේවිය ද, පුතණුවන් හා ඥාතීන් ද අත්හැර මේ වෙලාවේ කවුරුත් නැති මේ කැලේ වාඩි වී ඔබ මේ මොනවද කරන්නේ අනේ?'. මරඟනන්ගේ විප්‍රකාර දුටු තවුසන් කල්පනා කළේ 'මත්පැනින් මත් වූ බොළඳ මහළු වැඳිරි සමූහයක්' ලෙසිනි.[24]

කෙසේ වුව ද සියලු බාධක ජය ගෙන ශාක්‍යසිංහයන් බුදු වූ අයුරු ග්‍රන්ථයේ අවසාන පද්‍යයෙන් දක්වයි.

ඉත්ථං චිත්තප්‍රමොදේ මනසිජලලිතේ වර්තමානේ'පි
නෘත්‍යෙ
ධ්‍යායී පද්මාසනස්ථෝ නිහතභවගතිර්ඥේයධර්මාන්තදර්ශී
නිඃක්ලේශී ධර්මරාජඃ කනකමයගිරේර්නිර්විශේෂං
ස්ථිතෝ ය-
ස්තං වන්දේ ශාක්‍යසිංහං සුරනරනමිතං
භක්තිභාරානතෝ'හං. (පද්‍ය 108)

'මෙලෙසින් සිත් ප්‍රමෝද වූයේ සිතේ උපන් සතුටින් නැටුම් පවතින්නේ වුව ද, ධ්‍යාන ගත වූයේ පියුම් අසුන මත වැඩ

සිටියේ හරණ ලද සසර ගති ඇත්තේ ශ්‍රේය ධර්මධර වූයේ නික්ලේශී යම් ධර්මරාජ තෙමේ රන්වන් පව්වක මැනවින් වැඩ සිටියේ ද, බැතියෙන් බර වූ මම දෙව් මිනිසුන් විසින් වඳින ලද ඒ ශාක්‍යසිංහයන් වඳමි'.

මාරාඞ්ගනා විජයම් නම් මෙම කෘතිය බොහෝ ශාස්ත්‍රධාරීන්ගේ අභිවාදනයට හා ප්‍රශංසාවට හේතු වී ඇත. ඒ අතර වැල්ලවත්තේ ඤාණාභිවංස නාහිමියන් තත් ග්‍රන්ථය පිළිබඳ ප්‍රශංසා කොට ඇත්තේ පාලි භාෂාවෙනි.

'මාරාඞ්ගනා විජයන්ති - කතාය ලලිතවුත්තියා
උපමා රූපකාදීහි - ලංකතං පජ්ජගන්ථිමං.
පඨිත්වා තානි පජ්ජානි - පාමොජ්ජං අලභිං බහුං
රසණ්ණවේ ජලවිං සම්මා - සක්කෝව නන්දනේ වනේ.[25]

## ශ්වානස්තව කාව්‍යම්

ඤානේශ්වර නාහිමියන්ගේ අනෙක් ශතක කාව්‍යය වන්නේ ව්‍යවහාර වර්ෂ 2001 දී ප්‍රකාශයට පත් කළ 'ශ්වානස්තව කාව්‍යයයි'. ප්‍රථම මුද්‍රණයේදී එහි ශ්ලෝක 55 ක් පමණක් විය. එසේ වුවත් විවිධ ශාස්ත්‍රකාමීන්ගේ අභිරුචිය මත පද්‍ය 105 කින් යුක්ත කොට ශතකයක් බවට පත් කළ බව කර්තෘ නාහිමියෝ ද්විතීය සංස්කරණ සංඥාපනයෙහි සඳහන් කරති. මෙහි අනෙක් විශේෂත්වය වන්නේ සිංහල භාෂාවෙන් ශ්ලෝකයන්හි සාමාන්‍ය භාවය දක්වා සංස්කෘත නාගරී අක්ෂරයෙන් මුද්‍රණය කරවීමයි. මෙසේ සාමාන්‍ය භාවය සිංහල භාෂාවෙන් යෙදීම පිළිබඳ ඇතැම් සංස්කෘත විද්වතුන්ගේ ප්‍රශංසාවට ලක් වී නොමැත.[26] ඒ සඳහා නිදසුනක් දක්වා ඇත. 'ගර්හන්ති' නම් ක්‍රියාපදය ප්‍රථම පුරුෂ බහුවචන හෙයින් නිශ්චිතාර්ථයක් ගෙන දෙයි. එහෙත් ඊට 'නින්දා කරනවා' වශයෙන් පුරුෂය හෝ වචනය නොසලකා අර්ථයක් ලබා දී ඇත. මෙය ශිෂ්‍යයෙකුට අවිනිශ්චිත බවක් ගෙන දෙනු ඇත. 'ගර්හන්ති' යන්නට 'නින්දා කරත්' වශයෙන් අර්ථය යෙදුවේ නම් එය පොදු ජනයාට ද බාධාවක් නොවනු ඇත.



මේ වචනය පමණක් නොව ග්‍රන්ථයේ සියලු ම අර්ථයන් සාමාන්‍ය භාවයෙන් ම දක්වා ඇත්තේ මේ අයුරිනි. එබැවින් සිංහල භාෂාවේ ශාස්ත්‍රීය බව රැකගත්තේ නම් එය ග්‍රන්ථ ගෞරවයට හේතු වනු ඇත.

නාගරී අක්ෂරයෙන් මුද්‍රණය කරවීමෙන් අපේක්ෂා කොට ඇත්තේ දෙවි භාෂාවේ ජන්ම ස්ථානය ලෙස සැලකෙන භාරත දේශවාසීන්ගේ රස වින්දනය උදෙසා ග්‍රන්ථය ලබාදීමයි.

ග්‍රන්ථ නිර්මාණයේ අරමුණ පිළිබඳව තෙරිපැහැ සෝමානන්ද අනුනායක මාහිමියෝ මෙසේ සඳහන් කරති.

'බල්ලා ගැන කරන තුති පැසසුමක් හා ගුණ වැනුමක් වන එය ඉහළ තලයේ ගුණවතුනැයි කියන මිනිසුනට පවා ආදර්ශයක් දෙන්නකි. රජුන්, ධනවතුන්, බලවතුන්, වැනුම් කොට වෙහෙසට පත් කවියනට දෙන ප්‍රබල සන්නිවේදනයකි. වන සතුන්ගෙන් මිනිසාට එකතු වූ ආදිමයා බල්ලාය. එදා පටන් ඔහු මිනිසා අනුකරණය කළේය. මිනිසාගේ උදාරත්වය හා පෞරුෂත්වය තමා කෙරෙහි ආරෝපණය කරගන්නට වෙහෙස ගත්තේය. මිනිසාගේ උසස් ගති ඔහු තුළින් ක්ෂය වී යත්ම බල්ලා කරන්නේ ආත්ම පරිත්‍යාගයෙන් හෝ ඒවා සුරක්ෂිත කරගැනීමට වෙර දැරීමයි. එම යථාර්ථය තම සුනිපුණ නිර්මාණ ශක්තිය තුළින් ඤාණිස්සර නාහිමියෝ විනිවිද දකිති'.[27]

ග්‍රන්ථකරණයේ අවසන් අපේක්ෂාව ලෙස කර්තෘ නාහිමියන් සඳහන් කරන්නේ අසත්පුරුෂ ආශ්‍රයෙන් මිදී නිර්වාණය ම ලබා ගැනීමයි.

මා හුදසාධුෂු කදාචන ජන්ම මර්ත්‍යො
නිර්වාණමේව භවතාද් භවතෝ විමුක්තම්. (පද්‍ය 105)

'......මේ භවයෙහි උපන්නා වූ මට කිසිකලෙකත් අසත්පුරුෂයින් අතර මිනිස් උපතක් නොලැබේවා. නිවන ම ලැබේවා'.

කෙසේ වුව ද ග්‍රන්ථයේ ආකෘතිය හා අන්තර්ගතය පිළිබඳව ද අවධානය යොමු කිරීම උචිත වුවකි. ග්‍රන්ථය ආරම්භ කොට ඇත්තේ බෝධිසත්ව ජාතකයක් සිහිපත් කිරීමෙනි. එසේ ම ග්‍රන්ථයේ අතරින් පතරදී බුද්ධචරිතයේ සිදුවීම් පාඨකයාට මතක් කරදේ. අකීකරු භික්ෂූන් හැරදමා බුදුරදුන් පාරිලෙය්‍ය වනයට වැඩ ඇතෙකු සමග වාසය කිරීම (පද්‍ය 50), කළ ගුණ නොදත් දේවදත්ත ගිජකුළු පව්වට නැග බුදුරදුන්ගේ හිස මතට ගලක් පෙරළීම (පද්‍ය 55), සැරියුත් තෙරුන්ට උපකාර කළ රාධ බුදුරදුන් ලවා පැවිදි කරවීම (පද්‍ය 61), සිද්ධාර්ථ තවුසාණන් බුදු බව ලබා සත් දිනක් අනිමිස ලෝචනයෙන් කළ ගුණ සැලකීම (පද්‍ය 74) වැනි සිද්ධීන් සිහිපත් කිරීමෙන් මෙම ග්‍රන්ථය 'ධර්ම ග්‍රන්ථයක්' බවට පත් වී ඇතැයි කිවහොත් වඩා නිවැරදි වේ. ඊට අමතරව බුද්ධකාලීන සෝණක සිටුවරයාගේ උත්පත්තිය (පද්‍ය 36), තෝදෙය්‍ය සිටුවරයාගේ සුනඛෝත්පත්තිය (පද්‍ය 71) වැනි සිද්ධීන් දැක්වීමෙන් ප්‍රස්තුත මාතෘකවේ ගුණය වැඩි කළා සේ ම බෞද්ධ සංස්කෘතික ඉතිහාසයට ද වටිනාකමක් ලබා දේ. එමෙන් ම ග්‍රන්ථයේ ප්‍රථම ශ්ලෝක 50 ම අසත්පුරුෂයාගේ දුර්ගුණ ප්‍රකාශ කිරීම සඳහා යොදා ගෙන ඇත. කර්තෘ නාහිමි ම සඳහන් කරන පරිදි ප්‍රථම සංස්කරණයේ පද්‍යයන් අතරට අමුතුවෙන් පද්‍යයන් ඇතුළත් කරමින් ද්විතීය සංස්කරණය වෙනස් කොට ඇත. එබැවින් ග්‍රන්ථයේ ආකෘතියේ අක්‍රමවත් බවක් ද දක්නට හැක. මේ අනුව අසත්පුරුෂ දුර්ගුණ ලක්ෂණ නැවත නැවතත් ප්‍රකාශ කිරීම පාඨකයා විඩාවට පත් කිරීමක් ලෙස පෙනේ.

මිනිස් අසත්පුරුෂ දුර්ජනයන් අතර සුනඛ සත්ජනයා ශ්‍රේෂ්ඨ බව කර්තෘ නාහිමි දක්වා ඇත්තේ මානව වර්ගයා පරිහාසයට ලක් කිරීමක් මෙනි.



විචාරබුද්ධ්‍යා නිජභර්තෘවත්සලාත්
ප්‍රියානුරාගාත් ප්‍රණයාද් හිතෛෂිණාම්
පරෝපකාරාදපි වාස්තුපාලනාත්
විශිෂ්ටසත්ත්වසත්වදෘතේ න විෂ්ටපේ. (පද්‍ය 31)

'විචාර බුද්ධියෙන් ස්වකීය ස්වාමියා කෙරෙහි පවත්නා ආදරයෙන් ප්‍රියයන් කෙරේ ඇති ඇල්මෙන් හිතවතුන් කෙරෙහි ඇති දයාවෙන් අනුන්ට උපකාර කිරීමෙන් හා ගෙවතු පිටි රැකීමෙන් ද නුඹ හැර යහපත් සතෙක් ලෝකයේ ම නැත'.

පෙර කී පරිදි මෙහි ප්‍රථම ශ්ලෝක 50 ක පමණ පරාසය තුළ දක්නට හැක්කේ මහල්ලෙකු හා සුනඛයා අතර පවත්නා සම්බන්ධතාවයි. එහිදී සුනඛයාගේ ශ්‍රේෂ්ඨත්වය පුන පුනා මතු කොට දක්වයි. ඉන් අනතුරුව මානව වර්ගයා තුළ පවත්නා අසත්පුරුෂ ලක්ෂණ රාශියක් ද ග්‍රන්ථයේ විටින් විට දක්වා ඇත. එනම් අකෘතඥතාව, මානාධික බව, විශ්වාස කළ නොහැකි බව, කේලාම් කීම, ඵරුෂ වචන භාවිතය, ක්‍රෝධය, අන්‍යයන්ට නින්දා කිරීම වැනි අසත්පුරුෂ ගුණ මතු කරමින් ග්‍රන්ථයේ පසු කොටස වෙන් කොට ඇත. කෘතඥතාව සුනඛයා තුළ පවත්වා උසස් ගුණයකි. නිදර්ශන ලෙසින් පහත සඳහන් පද්‍ය කීපය බලන්න.

අඥඃ පරෛරුපකෘතෝ'පි හිරණ්‍යරත්නෛ-
චේතඃ ප්‍රදූෂයති බාදති පෘෂ්ටමාංෂම්
අල්පාන්නපානවිධිනා පුෂතෝ භවාන් හි
කෞලේයකෝ භවති සත්පුරුෂඃ කෘතඥඃ. (පද්‍ය 40)

'මෝඩයාට රත්රනින් මැණික්වලින් උපකාර කළත් ඔහු සිත කිළිටු කරනවා. පිට මස් කනවා. බත් ටිකක් දීමෙන් හදා වඩා ගත් බල්ලා වන උඹ කළ ගුණ දන්නා සත්පුරුෂයායි'.

නීචා භවන්ත්‍යභිමුඛේ ප්‍රියභක්තමිත්‍රා-
ණ්‍යතේ පරාඞ්මුඛමහාපරිපවෝ'කෘතඥඃ
දුෂ්ටාවමාන්‍යශයදුර්ජනමර්ත්‍යජාත්‍යා-
හෝඃ ශ්වන් භවේද් වරතමං භවතෝ'ධිජන්ම. (පද්‍ය 56)

'බල්ලාණෙනි, නීචයෝ මුහුණ ඉදිරියේ හොඳම මිතුරෝ. පිටතදී කළ ගුණ නොදන්නා මහ හතුරෝ. දුෂ්ට නින්දා කටයුතු කපටි දුර්ජන මිනිස් ජාතියට වඩා නුඹේ බලු උපත ඉතා වැදගත්'.

නෛවාස්ති සඤ්චිතධනං භවනඤ්ච වස්තුං
දාසෝපකාරකජනෝ ජනනී පිතා වා
කෞපීනමේව විභවෝ මම දුර්ගතස්‍ය
බන්ධුඃ සුතඃ පරිජනශ්ච සඛා ත්වමේව. (පද්‍ය 77)

'මා රැස් කර ගත් මිළ මුදලක් නැහැ. විසීමට ගෙයක් දොරක් නැහැ. වැඩකාරයෙකු, උදව්වට කෙනෙකු, මවක හෝ පියෙකුදු නැහැ. දුප්පත් මට ඇති වස්තුව අමුඩය පමණයි. නෑයාත්, පුතාත්, පිරිවර ජනයාත්, මිතුරාත් නුඹ පමණයි'.

මානව වර්ගයාගේ චර්යාව පිළිබඳ මානසික 'විඩාවක්' මේ ග්‍රන්ථ පඨනයෙන් ඇතිවීම වැළැක්විය නොහැක. එමෙන් ම සුනඛ වර්ගයා පිළිබඳ කරුණා රසයක් ජනනය වීම 'මිනිස්' හදවතකට අරුමයක් නොවේ. සමස්තයක් ලෙස ගත් විට ශ්වානස්තව කාව්‍යය මෑත යුගයේ ශ්‍රී ලාංකික සංස්කෘත සාහිත්‍ය තුළ බිහි වූ නව තේමාවක් රැගත් ශතකයක් වශයෙන් අගය කළ හැක.

**ප්‍රශස්ති කාව්‍යයෝ:**

ප්‍ර පූර්ව /ශංස් ධාතුවෙන් සිද්ධ 'ප්‍රශස්ති' පදයෙන් අර්ථවත් වන්නේ 'පැසසුම, ගුණවැනුම, යමෙකුගේ ගුණ වණමින් ලියන ලද කුඩා කව, ශ්‍රේෂ්ඨත්වය, මහිමය, ආසිරි, ආසිරි පැතුම, තියු ගීය වැනි අර්ථ රාශියකි.[28] ඒ අනුව සංස්කෘත සාහිත්‍යයේ ප්‍රශස්ති කාව්‍යයන්හි ආරම්භය වෛදික යුගය තරම් ඈතට විහිදෙතැයි අනුමාන කෙරේ. ඍග්වේදයේ 'දාන ස්තුති' හෙවත් දානපතියාට ස්තුති කරන ගී මේ සඳහා ඇතැමෙක් නිදර්ශන කරති. එසේ ම පසුකාලීනව ව්‍යාප්ත වූ ඉතිහාස, පුරාණ හා ආඛ්‍යාන යාගයන්හිදී කියවනු ලැබූ අතර ඒ සඳහා විශේෂ



'වෛතාලිකයෝ' පිරිසක් සූදානමින් සිටියහ. ඊට අමතරව බාහිර සමාජයේ විනෝදාස්වාදය සඳහා පමණක් නොව රාජ ස්තුති මෙන් ම දේව වර්ණනා කිරීම සඳහා ද පිරිසක් සූදානම් වූහ. මොවුහු 'කථක' (කථාකරුවන්), ආඛ්‍යානවිද් (ආඛ්‍යානවරුන්), ඓතිහාසික (ඉතිහාස කථා දත් අය), පෞරාණික (පුරාණ කථා දත් අය) වශයෙන් විවිධ අවස්ථාවන්හිදී විවිධ නම්වලින් හඳුන්වන ලදහ. ඍග් වෛදික යුගය තරම් ඈත අවධියක පැවැති ස්තුති ගී සම්ප්‍රදාය හා පසුකාලීනව පැවැති 'නාරාශංසි ගාථා' හෙවත් වීර ස්වභාවය වර්ණනා කරන ගාථා' සම්ප්‍රදාය එකතුවීමෙන් නව ආකාරයේ කාව්‍ය සාහිත්‍ය වංශයක් බිහිවිණැයි විද්වත්හු කල්පනා කරති. එනම් 'ප්‍රශස්ති කාව්‍ය සාහිත්‍යයයි'. මෙම සාහිත්‍යය වංශය පෙර සඳහන් කළ පරිදි කථිකයන්, ඓතිහාසිකයන් හා පෞරාණිකයන් විසින් ඉදිරියට ගෙන යන ලදහ. එහි අනෙක් පියවර වූයේ ඍෂිකුල වැනි වංශ පිළිබඳ වර්ණනා එක්වීමයි. මෙය 'අනුවංශ ශ්ලෝක' වෙත් 'අනුවංශ්‍යා ගාථා' නමින් හැඳින්විණ.[29] මෙසේ මෙම ප්‍රශස්ති කාව්‍ය සම්ප්‍රදාය වර්තමානයේ වුව ද සංස්කෘත සාහිත්‍යය තුළ විද්‍යමාන වන ආකාරය පෙනේ. ඒ සඳහා නිදර්ශන කළ හැක්කේ දවුල්දෙණ ඥානේශ්වර නාහිමියන්ගේ ප්‍රශස්ති කාව්‍ය සමූහයයි.

මෙම ලේඛනය ආරම්භයේදී උන්වහන්සේ විසින් මෙතෙක් ඉදිරිපත් කොට ඇති කාව්‍ය සමූහයක ලේඛනයක් දක්වා ඇත. සංස්කෘත සාහිත්‍යයේ පුරාණ කාලයේ සිට පැවැති මෙම කාව්‍ය සම්ප්‍රදායට ශ්‍රී ලංකාව තුළ අභිනව ප්‍රවේශයක් ලබා දෙන ලද්දේ උන්වහන්සේ විසින්යැයි කිවහොත් වඩා නිවැරදි වේ. එබැවින් දවුල්දෙණ ඥානේශ්වර නාහිමියන්ගේ ප්‍රධාන උද්දේශ්‍ය වී ඇත්තේ ශ්‍රී ලංකාවේ යතීන්ද්‍රයන් වහන්සේලාගේ ගුණස්තවයන් ඉදිරිපත් කරමින් ශුභාශිංසනය කිරීම පමණක් නොව ඓතිහාසික සංස්කෘත කාව්‍ය සාහිත්‍යයේ ඒකදේශයක් සම්පූර්ණ කිරීමක් ද වේ. එබැවින් ඥානේශ්වර නාහිමියන්ගේ ප්‍රශස්ති කාව්‍ය කුශලතාව ප්‍රකට කෙරෙන නිදර්ශන කීපයක් ගෙනහැර දැක්වීම වටී.

- **ශ්‍රී සුමඞ්ගල ස්වාමීන්ද්‍ර ප්‍රශස්තිඃ**
  කො'යං විද්වාන්යතීන්ද්‍රඃ සකලබුධජනෛර්මානිතෝ
  බුද්ධඝෝෂ
  ආචාර්යෝ බුද්ධදත්තඃ කවිකුලතිලකඃ ශාරිපුත්‍රො
  යතිර් වා
  කිං වා ශ්‍රී රාහුලාඛ්‍යො විත්තසිතයශාඃ කාව්‍යකර්තාථ
  වා කිං
  වක්තාරස්තස්‍යපාදාම්බුජයුගමනසං භේජිරේ
  නිත්‍යමිත්ථං. (පද්‍ය 01)

- **විදුරුපල ශ්‍රී ප්‍රියතිෂ්‍ය මහානායක ස්වාමීන්ද්‍ර ගුණානුස්මෘතිඃ**
  ශ්‍රීමල්ලඞ්කොර්ධවරාෂ්ට්‍රෙ'මරපුරවිදිතේ
  භික්ෂුවංශෙ'ග්‍රනේතා
  ලක්ෂ්ම්‍යා ශුභ්‍රාංශුවද් යඃ
  සුචිරමුදලසච්ඡාසනාබ්භ්‍රෙ'ර්කබන්ධෝඃ
  ස්වාමින්ද්‍රස්‍ය ප්‍රතිතෙ විදුරුපල ඉති ග්‍රාමවර්යෙය්‍ය ප්‍රියාදි
  තිෂ්‍යාඛ්‍යාතස්‍ය තස්‍ය ස්මරති ගුණලවං භක්තිපූර්වං
  ජනෝඝයම්. (පද්‍ය 01)

- **ශ්‍රී ආනන්ද මෛත්‍රෙය මහානායක ස්වාමීන්ද්‍ර ප්‍රශස්තිඃ**
  මහාත්මනෝ යස්‍ය පදාම්බුජද්වයං
  නිසේවතේ සාධුජනෝ'නිශං මුදා
  ආනන්ද මෛත්‍රෙය ඉති ප්‍රතීතඃ
  ස රාජතාල්ලෝකහිතාය නේතා. (පද්‍ය 02)

මෙතෙක් දවුල්දෙණ ඥානේශ්වර නාහිමියන් විසින් සංස්කෘත සාහිත්‍යය උදෙසා සිදු කළ දායකත්වය අංශ කීපයක් යටතේ විමසන ලදී. ක්‍රි.ව. 4 වැනි සියවසේ සිට[30] ප්‍රචාරය වූ ශ්‍රී ලාංකික සංස්කෘත සාහිත්‍යය 21 වැනි සියවසේදී දවුල්දෙණ ඥානේශ්වර නාහිමියන් විසින් වඩාත් දීප්තිමත්තාවට පත් කළ බව කිවහොත් වඩාත් නිවරද වේ. මේ නිසා වර්තමානයේ සංස්කෘත භාෂා අධ්‍යයනයේදී උන්වහන්සේ විසින් නිර්මාණය කළ ග්‍රන්ථ සේ ම සෙසු සංස්කෘත විද්වතුන් විසින් නිර්මිත ග්‍රන්ථ අධ්‍යයනය සඳහා යොදා ගැනීම වඩාත් කාලෝචිත වූවකි.[31]



## ආන්තික සටහන්

1 දවුල්දෙණ ඥානේශ්වර නාහිමිපාණන් වහන්සේ උඩරට ඌව පරණගම දවුල්දෙණ ග්‍රාමයේ උපත ලද අතර කුඩා කල ඌව පරණගම මැදවෙල පාඨශාලාවෙන් මූලික අධ්‍යාපනය ලැබූහ. පැවිදි වීමෙන් අනතුරුව කොළඹ විද්‍යෝදය පිරිවෙණින් උසස් අධ්‍යාපනය ලබා ශාස්ත්‍රීය කුශලතා ප්‍රකට කරන්නට වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස 'ශ්‍යාමරාජ' නම් තත් පිරිවෙණින් පිරිනමනු ලැබූ උසස් ම ත්‍යාගය ලැබීම විශේෂ වේ. ශ්‍රී ලකා ප්‍රාචීන භාෂොපකාර සමාගමේ විභාග පටිපාටීන් ක්‍රමානුකූල සාමර්ථ්‍ය ලැබීමෙන් රාජකීය පණ්ඩිත උපාධිය ලැබූහ. එසේ ම 'ග්‍රන්ථ විශාරද' උපාධිය ස්වයං රචිත සංස්කෘත කාව්‍ය ග්‍රන්ථයක් ඉදිරිපත් කිරීමෙන් එම සමාගමෙන් ම ලැබීම උන්වහන්සේගේ සංස්කෘත භාෂා පටුත්වය ප්‍රකට කරන්නකි.

2 **වෛරාග්‍ය චින්තා**. පද්‍ය 28.
උන්වහන්සේගේ සංස්කෘත භාෂා පටුත්වය තමන් වහන්සේ ම දක්වා සිටී.
පද්‍යප්‍රියෝ'ප්‍රතිමසංස්කෘතභාෂිතේ'යං
ගාම්භීර්යමප්‍යගණයන් විදුෂාං ප්‍රශස්තම්
සාර්ථං සුවෘත්තසරසං සදලඞ්කෘතිඤ්ච
කාව්‍යං නවං කතිපයං රචයාඤ්චකාර.

ඉතා උසස් සංස්කෘත භාෂාවේ ගැඹුරු බව ද නො සලකා පද්‍ය ප්‍රිය කරන මේ තෙමේ පඬුවන් විසින් පසස්නා ලද අරුත් සහිත මනා වෘත්ත හා මනා අලංකාර යුත් අළුත් කාව්‍ය කීපයක් රචනා කළේය.

3 ප්‍රාචීනභාෂොපකාර සඞ්ගමෙන පරීක්ෂ්‍ය ච
ග්‍රන්ථවිශාරදොපාධිප්‍රදානෙනාභිසම්මතම්. කර්තෘසන්දර්ශනම්, **වෛරාග්‍යචින්තා**

4 තිතීර්ෂුර් භවසංසාරං ස්මාරං ස්මාරං ත්‍රිලක්ෂණම්
වෛරාග්‍යචින්තාඛ්‍යකාව්‍යං චකාරේදං විරාගකෘත්. කර්තෘසන්දර්ශනම්,
**වෛරාග්‍යචින්තා**

5 හැඳින්වීම. **වෛරාග්‍ය චින්තා**.

6 ඉත්‍යෙෂා ව්‍යුපශාන්තයේ න රතයේ මොක්ෂාර්ථගර්භාකෘතිඃ
ශ්‍රොතෘණාං ග්‍රහණාර්ථමන්‍යමනසාං කාව්‍යෝපචාරාත් කෘතා
යන්මොක්ෂාත්කෘතමන්‍යදත්‍ර හි මයා තත් කාව්‍යධර්මාත් කෘතං
පාතුං තික්තමිවෞෂධං මධුයුතං හෘදයං කථං ස්‍යාදිති. සෞන්දර, 18.63)

'මෙසේ වෙනතක යොමු වූ සිත් ඇති ශොතෘන්ගේ ග්‍රහණය පිණිස කරන ලද මේ නිර්වාණාර්ථයන් ඇතුළත් කොට ඇති කෘතිය සන්සිඳීම පිණිස වන්නේය. අභිරමණය සඳහා නොවන්නේය. මෙහි මෝක්ෂයෙන් බැහැර යම් වර්ණනයක් කරන ලදද එය මී හා යුක්ත තිත්ත ඖෂධය කෙසේ නමුදු බීමට ප්‍රිය වේයැයි කාව්‍ය ධර්මයෙන් කරන ලදී'.

7 ස්නේහොදකෙන නිතරාමභිෂිච්‍ය බාල
මඞ්කේ නිධාය ලලනේන තතො යුවත්‍යඃ - **වෛරාග්‍යචින්තා**. පද්‍ය 8

8 ශුශ්‍රූෂයා ගුරුජනාද් විදුෂාං වරෙණ්‍යාද්
විද්‍යාදිනෛකවිෂයං චිරමධ්‍යගීෂ්ට. **වෛරාග්‍යචින්තා**. පද්‍ය 1.19

9 පඤ්චස්කන්ධ උපමාව පෙළ ග්‍රන්ථයන්හි මෙසේ දැක්වේ.
ඵේණපිණ්ඩූපමං රූපං වේදනාබුබ්බුලූපමා
මරීචිකූපමා සඤ්ඤා සංඛාරාකදලූපමා
මායූපමං ච විඤ්ඤානං දීපිතාදිච්චබන්ධුනා.

සංයුත්ත නිකාය 3. **ඵෙණපිණ්ඩූපම සූත්‍රය.** බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා (පුනර්). 2004. පි. 244.

10 එය මෙසේ දැක්වේ.

සංසාරවිෂවෘක්ෂස්‍ය ද්වේ ඒව රසවත් ඵලේ
කාව්‍යාමෘතරසාස්වාදඃ සංගමඃ සජ්ජනෛඃ සහ. (හිතෝපදේශය, පද්‍ය 154)

තිලකසිරි, සිරි. (2007). **හිතෝපදේශය.** රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ. පි.30.
මෙය ම ව්‍යාසකාරයේ මඳක් වෙනස්ව සඳහන් වේ.

සංසාරවිෂවෘක්ෂස්‍ය ද්වයමේවාමෘතං ඵලං
සුභාෂිතරසාස්වාදස් සජ්ජනෛඃ සහ සඞ්ගමඃ. (පද්‍ය 63)

(සංස්). නැත. වර්ෂය නැත. **ව්‍යාසකාරය හා හිතෝපදේශය.** සමයවර්ධන පොත් හල, කොළඹ.

හිතෝපදේශ සංස්කරණයක ඊටත් මඳක් වෙනස් වේ.

සංසාරවිෂවෘක්ෂස්‍ය ද්වේ ඒව මධුරේ ඵලේ
කාව්‍යාමෘතරසාස්වාදඃ සංගමඃ සජ්ජනෛඃ සහ. (පද්‍ය 163)

අලගියවන්න, පුවසති. (1998). **හිතෝපදේශය.** මොඩන් පොත් සමාගම, නුගේගොඩ. පි.122.

11 ධර්මරත්න, පණ්ඩිත කළුපන. (1998). **ලෝවැඩ සඟරා වර්ණනාව.** බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

12 ඕස්ට්‍රේලියාභ්වයේ දේශේ වසන් ධර්මනිකේතනෝ
යශෝධරාචරිතාඛ්‍යකාව්‍යං ප්‍රණීතවානිදම්. (පද්‍ය 09)

13 යශෝධරාචරිතම්. පෙරවදන

14 ජගත්‍රයං ධර්මමයප්‍රභාතිර් විරාජයේද් භාස්කරවද් යථාවත්. (පද්‍ය 2.25)

15 **මජ්ඣිම නිකාය, අරියපරියේසන සූත්‍රය.** බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා (පුනර්). 2004. '........සො ඛො අහං භික්ඛවෙ අපරෙන සමයෙන දහරොව සමානො සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනේන සමන්නාගතො පඨමෙන වයසා අකාමකානං මාතාපිතුන්නං අස්සුමුඛානං රුදන්තානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිං'.

16 කාචිද් විභූෂයති දර්පණ සක්තහස්තා
බාලාතපේෂු වනිතා වදනාරවින්දම්
දන්තච්ඡදං ප්‍රියතමේන නිපීතසාරං
දන්තාග්‍රභින්නමවකෘෂ්‍ය නිරීක්ෂතේ ච. සෘතුසංහාර කාව්‍යම්. 3.13

17 රුරෝද මම්ලෞ විරුරාව ජග්ලෞ
බභ්‍රාම තස්ථෞ විලලාප දධ්‍යෞ
චකාර රෝෂං විචකාර මාල්‍යම්
චකර්ත වක්ත්‍රං විචකර්ෂ වස්ත්‍රම්. (සෞන්දරනන්ද මහා කාව්‍යම්. 6.34)

නෘපස්තු තසෛ්‍යව විවෘද්ධිහෙතොස්
තද්භාවිනර්ථෙන ච චෝද්‍යමානඃ
ශමේ'භිරේමේ විරරාම පාපාද්
භේජේ දමං සංවිබභාජ සාධූන්. (බුද්ධචරිත මහා කාව්‍යම්. 2.33)

18 ප්‍රාචීනභාෂොපකාරසමාගමාභ්‍යුනුඥයා
මහේන්ද්‍රක්ෂීණාශ්‍රවස්‍යාගමනං කෘතවානිදම්.
කර්තෘ සංදර්ශනම්. **මහාමහේන්ද්‍රක්ෂීණාශ්‍රවාගමනම්.**



19 ප්‍රාචීන භාෂොපකාර සමාගමේ ඉතිහාසය මෙසේ සඳහන් වේ. '.......... තෙවිසි දෙනෙකුගෙන් ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම 1902 ජුලි මස 24 දා ආරම්භ විය. මේ වනාහි තෙවලා දහමත් භාෂා ශාස්ත්‍රත් පිළිබඳ උසස්තම පරිඥානයක් ඇති මෙරට පඬිවරුන්ගේ පර්ෂදය විය. සමාගමේ පරමාර්ථය වූයේ එළු, පාලි, සංස්කෘත හා තදනුගත විෂයයන් සම්බන්ධයෙන් විභාග පවත්වා ප්‍රාචීන හා පුරාවිද්‍යාවත් පිළිබඳ පූර්ණ ඥානයක් අත්පත් කරදීමත්, එහි මූලික අරමුණු අතර විය. .......'

විස්තර බලන්න. රාජකීය පණ්ඩිත ආචාර්ය අභයරත්න අදිකාරි, 'ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂොපකාර සමාගමේ සංක්ෂිප්ත ඉතිහාසය', **ප්‍රාචීන ශාස්ත්‍රීය සංග්‍රහය.** (2002). (සංස්. තෙරිපැහැ සෝමානන්ද අනුනාහිමි සහ ආදීහු). ප්‍රාචීන භාෂොපකාර සංගමය. පිටු.1-40

20 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1959). **ඌණ පූරණ සහිතො මහාවංසො.** ගුණසේන සහ සමාගම, කොළඹ. පි.71

21 තිරෝහිතානෘද්ධිබලාච්චතුර්යතීන්
සහණ්ඩුකාඛ්‍යාතගෘහස්ථසෞගතම්. **මහාභහේන්ද්‍රක්ෂීණාශ්‍රවගමනම්.** පද්‍ය 13

22 හැඳින්වීම. **සර්වේ සංස්කාරාවිපරිණාමධර්මාඃ.**

23 තිලකසිරි, ජයදේව. **සංස්කෘත කාව්‍ය සාහිත්‍යය.** (1961). ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොළඹ. පි.94.

24 ශීධුපානමත්තමුග්ධවෘද්ධධෘෂ්ටවානරී
වෘන්දකේලිරිත්‍යචින්තයද් විශුද්ධචේතසා. **මාරාඞ්ගනා විජයම්.** පද්‍ය 107

25 සංස්කාරකවරු. (1997). **ශ්‍රී ඥානේශ්වර ප්‍රශස්තිඃ.** මුද්‍රණය. ශ්‍රී දේවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, දෙහිවල. පි. 9.

26 සේනානායක, ජී.එස්.බී. (1998). **ශ්‍රී ලංකාවේ සංස්කෘත සාහිත්‍යය.** සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ. පි. 61

27 ප්‍රස්තාවනා. (2001). **ශ්වානස්තව කාව්‍යම්.** පැරණි පොත් සමාගම, නුගේගොඩ.

28 අලගියවන්න, පුවසති. (2004). **සංස්කෘත සිංහල ශබ්ද කෝෂය.** සූරිය ප්‍රකාශකයෝ, කොළඹ. පි. 544

29 ජයදේව තිලකසිරි. (1999). **සංස්කෘත කාව්‍ය සාහිත්‍යය.** එස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ. පි. 12 - 14

30 බලන්න. ආනන්ද ඩබ්.පී. ගුරුගේ. (2010). **සිංහලය හා සංස්කෘතය සහ සංස්කෘත කාව්‍යය හා නාට්‍යය.** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ. පි. 11 - 23

31 ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන් අතර ප්‍රථම වරට 1998 දී බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය '**ශ්‍රී ලාඞ්කේය නූතන සංස්කෘත සාහිත්‍යය**' අධ්‍යයනය එම විශ්වවිද්‍යාලයේ සංස්කෘත විශේෂවේදී නිර්දේශ පත්‍රයට එකතු කිරීම විශේෂත්වයකි.